# ශක්තිය

පොදු ජන හඬේ දෝංකාරය

තැපැල් කාර්යාලයේ ලියාපදිංචි කරන ලදි : QD/05/NEWS/2019

වෙළුම : 17 | කලාපය : 07 | අන්තර්ජාල ලිපිනය - www.shakthiya.org | 2019 සැප්තැම්බර් | මිල රුපියල් 30.00යි.


## ජනාධිපතිවරණයට කොමිසම සැරසේ

ජනාධිපතිවරණය පැවැත්වීම සඳහා කොමිසමේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා පසුගිය 17 වෙනිදා පක්ෂ ලේකම්වරුන් කැඳවා ඉදිරි දින කිහිපය තුල නාමයෝජනා සඳහා දින නියම කරන බව පවසයි.

මේ සඳහා දැනට පවතින නීති රීති වර්ථමානයට ගැලපෙන පරිදි පොලිසිය සමගද සාකච්ඡා කර ජනතාව දැනුවත් කරන බවද අපහාසාත්මක හා ද්වේශසහගත ප්‍රකාශ හා ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම සඳහා ද නීත්‍යානුකූලව පියවර ගන්නා බව පක්ෂ ලේකම්වරුන්ට දැනුම්දී ඇත.

ඉදිරි නොවැම්බර් 25 දෙසැම්බර් 10 අතර දිනකදී ජනාධිපතිවරණය පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කරමින් පවතින බවද පවසා තිබේ.

# අපේක්ෂක හබය නිසා යූ.ඇන්.පී.ය ගරාවැටේ



ලංකා ඉතිහාසයේ සිදුකල ලොකුම හොරකම ලෙස වාර්තාවන මහ බැංකු මංකොල්ලයේ මෙහෙයුම්කරු වූ රනිල් වික්‍රමසිංහ, බටහිර බලවතුන් හට කොතරම් ගැති වුවද යූ. ඇන්. පී. අපේක්ෂකයා ලෙස ඔහු ගැන තිබූ විශ්වාසය බිඳීගොස් ඇති බව තානාපති කාර්යාල වලින් වාර්තාවේ.

ඒ වෙනුවට බටහිර බලවතුන් තම නියෝජිතයා ලෙස තෝරාගන ඇත්තේ කරූ ජයසූරිය බවද වාර්තාවේ.

එහෙත් එක්සත් ජාතික පක්ෂයේ බහුතරයක් දෙනා අතර සජිත් ප්‍රේමදාස පෙරට පැමින ඇත.

එබැවින් සජිත් ප්‍රේමදාසට ජනාධිපති අපේක්ෂකත්වයද රනිල්ට හෝ කරූ ජයසූරියට අගමැතිකමද ලබාදීමේ යෝජනාවක් ඉහල පන්තියේත් හා බටහිර තානාපති අංශවලින් ඉදිරිපත්වී ඇතැයි සිතිය හැකිය.

එක්සත් ජාතික පක්ෂයට ජනපති තරගයෙන් ඉදිරියට ඒමට ඉඩ කඩ නොමැත්තේ නම් ජනතා විමුක්ති පෙරමුණ තරගයෙන් ඉවත්කර ගැනීමටද නොයෙක් රහස් උපක්‍රම දැනටමත් දියත්වී ඇති බව සැලවේ.

ලංකාවේ ඉහල පංතියට සහ බටහිර තානාපතිවරුන්ට සජිත් ප්‍රේමදාස ගැන බලවත් විශ්වාසයක් නැතත්, ඔවුන්ගේ ප්‍රධාන විශ්වාසවන්තයෙකු වන මංගල සමරවීරගේ තර්කය වී ඇත්තේ එක්සත් ජාතික පක්ෂය බේරාගත හැකි වන්නේ නම් ඒ සඳහා තෝරාගත යුතු අපේක්ෂකයා සජිත්ම වියයුතු බවයි.

පෙබරවාරි 10 දින පැවති පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵලයත් සමග එතෙක් පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂ, යූ.එන්.පී පුට්ටුව දෙදරායාමත්, සිරිසේන ඉවත් කර රනිල් තහවුරු කිරීමට ගත් ප්‍රයත්නයත් සියල්ල අසාර්ථක වීමත්, සිංහල, මුස්ලිම් කෝලාහලයක් අවුලුවා මැතිවරණ සිතියම අකුලා දැමීමට දැරූ වෑයම අසාර්ථක වීමත්, අධිරාජ්‍යවාදී නොසිතූ තත්වයකි.

එසේම ජනපති සිරිසේන සජිත් සමග එකගතාවයකට ගෙන ඒමේ සැලැස්මක් ගැන සිතන බවද වාර්තා වන අතර, ඉහල පංතියේ බෙදීම වලක්වා ඔවුන්ගේ පොදු පංති උවමනාව වෙනුවෙන් මෙවැනි යටි ගිවිසුම් හරස් ගිවිසුම් කිහිපයක්ම ඇතිවිය හැකි බව දේශපාලන නිරීක්ෂක මතය වී තිබේ.

එවැනි දේශපාලන ඩීල්වල දිග, පළල ඉදිරි මාස කීපය තුළ දිග හැරෙන ආකාරය බලාගත හැකි බවත්, මේ සඳහා අධිරාජ්‍යවාදීන් කෝටි ගණන් මුදල් යොදවමින් සිටින බවත්, වාසුදේව සහෝදරයා ශක්තියට පැවසීය.

## රත්නපුර දිස්ත්‍රික්කයේ පවුල් 6579 කට නිවාස ඉදිකිරීමට ඉඩම් නෑ

රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර සහෝදරයා ශක්තියට පැවසුවේ රත්නපුර දිස්ත්‍රික්කයේ නිවාස ඉදිකර ගැනීම සඳහා ඉඩම් නොමැති පවුල් 6579 ක් සිටින බවත්, මේ ගැටළුව එතුමා පාර්ලිමේන්තුවේදී ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයාන් කරුනාතිලක මහතාගෙන් ප්‍රශ්න කල බවත් එයට පිළිතුරු වශයෙන් ඔහු පවසා ඇත්තේ රත්නපුර ප්‍රදේශයේ මේ වනවිට ඉඩම් හිඟයක් පවතිව බවය.

වාසුදේව සහෝදරයා වැඩිදුරටත් පවසා සිටියේ රත්නපුර දිසත්‍රික්කයේ මේ වනවිට රජයේ ඉඩම් අක්කර 50 000 කට වඩා තිබෙන බවත්, ඒවා වැවිලි සමාගම් වලට බදුදී ඇති අතර ඉන් 10% වඩා වැඩි ප්‍රදේශයක සරු වගාවක් නොමැති අතර, ඒ තුල මේ අවශ්‍ය ඉඩම් අක්කර 1200 පවතින බවයි.

## සරසවි අනධ්‍යන සේවකයන් අඛණ්ඩ වර්ජනයක

විශ්වවිද්‍යාල අනධ්‍යන සේවක සේවිකාවෝ 2019.09.10 දින සිට අඛණ්ඩ වැඩවර්ජනයක නිරතවීමට තිරනය කර ඇත.

වැටුප් විෂමතා ඉවත්කරන ලෙස බලකරමින් අනධ්‍යයන විධායක ශ්‍රේණි හා පරිපාලන නිලධාරීන් යන අංශවලට අයත් වෘත්තීය සමිති 27ක් එම වර්ජනයට එක්වන බව ද විශ්වවිද්‍යාල වෘත්තීය සමිති එකමුතුව ශක්තියට පැවසූ අතර, වැඩිදුරටත් ඔවුන් සඳහන් කර සිටියේ රාජ්‍ය සේවයේ අනිකුත් සේවකයන්ට 2015 වසරෙන් පසුව මේවන විට 107% කින් වැටුප් වැඩිවීමක් ලබාදී ඇතත්, විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ලැබී ඇත්තේ 92%ක වැටුප් වැඩිවීමක් පමණක් බවත් එම වෘත්තීය සමිති එකමුතුව පවසයි.

අනධ්‍යන සේවක ගැටලුවට විසඳුම් ලබා දෙන්නැයි ඉල්ලමින් මීට ඉහතදී බලධාරීන් සමග සාකච්ඡා පැවති නමුත් ඉන් කිසිදු ප්‍රතිඵලයක් අත්නොවූ බව ද එම වෘත්තීය සමිති එකමුතුව ශක්තියට පවසන ලදි.



මෙවර ඡන්දෙට ජවිපේ සීනුව ලකුණ අත්හරිනවා.

-ලාල්කාන්ත -

එහෙනම් ඕකේ ඉන්න අයට හරියන්නේ කුණු බාල්දිය ලකුණ.

-ලැන්ටි-

ශක්තිය
— පොදු ජන හඬේ දෝංකාරය —

49/1, විනයාලංකාර මාවත, කොළඹ 10.
ෆැක්ස්/ දුරකථන: 0112684820
විද්‍යුත් තැපැල: Shakthiya85@gmail.com
වෙබ් අඩවිය: www.shakthiya.org

# ජාතික නිදහසේ දෙවෙනි ගමන

තිස් අවුරුදු ජනවාර්ගික යුද්ධය ශ්‍රී ලාංකික ජන ජීවිතය සිදුරු කළ කුරිරු ඛේදවාචකයකි. නිදහසින් පසුව බිහිවූ ජනාධිපතිවරුන් 4 දෙනෙකුටම යුද්ධය හිඟන්නාගේ තුවාලයක් විය. එක් ජනාධිපතිවරයෙකුගේ අවසානය සිදුවූයේ හදිසියේ මහපාරේ පුපුරා හැලුනු අමු මස්ගොඩක් ලෙසය. ඉන්දියානු අගමැති අපේක්ෂකයෙක් තමිල්නාඩුවේදී අවසානය දුටුවේ මල්මාලවක් පුපුරා හිස කඳින් වෙන් කරමින්ය. බටහිර සාම සැලසුම අනුව ත්‍රස්තවාදීන් සමඟ රට බෙදා ගැනීමට බලකර නීත්‍යානුකූල ලාංකික රාජ්‍යයේ අවසානය සනිටුහන් කිරීමට පාවාදෙන්නෝ සැරසුනහ. ලාංකිකයින් දීනව බෙදුම්වාදයට යටත්වනවාද නැත්නම් සටනකින් හෝ රට බේරාගන්නවාද යන උභතෝකෝටිකය එවකට 2005 ජනාධිපතිවරණ අපේක්ෂක මහින්ද රාජපක්ෂ මහතාට මුහුණ දිය යුතු අභියෝගය විය.

ඡන්දයෙන් තේරී පත්වූ 5 වෙනි ජනාධිපති ලෙස දිවුරුම් දුන් මහින්ද සාමයේ දෑත් දිගුකල විට බෙදුම්වාදීන් පිලිතුරු දුන්නේ කැබෙතිගොල්ලෑව ගම්වැසියන් කපාකොටා දැමීමෙනි. නව රජය යුද්ධයට කැඳවා ගැනීමට ත්‍රස්තවාදීන් ක්‍රියාකලේ මාවිල්ආරු සොරොව්ව අත්පත් කර ගනිමිනි. ලාංකික රාජ්‍ය කැඩීබිඳී යානොදී ප්‍රගතිශීලීන්, වාමාංශිකයින්, දේශප්‍රේමීන් එකපෙලට සිටුවා ගෙන සංඝරත්නය ඇතුලු සෙසු ආගමික නායකයන්ගේ ආශිර්වාදය මැද මහින්ද ජනපති රට බේරා ගැනීමට පෙරමුණ ගත්තේය.

යුද්ධයත්, ජනතා ප්‍රජාතන්ත්‍රවාදයත්, සංවර්ධනයත් එක මිටට ගනිමින් ඉදිරියට යාමට ගෝඨාභය සොයුරුට යුද්ධයේ වගකීම් භාර කෙරුනේ ආරක්ෂක ලේකම් ලෙස පත් කිරීමෙනි. පාර්ලිමේන්තුවේ නායකයා චමල්ය. ආර්ථික සංවර්ධනය බැසිල්ට භාර කලේය. ත්‍රස්තවාදය පරාජය කිරීමේ අරමුණ ජය ගැනීමට ආරක්ෂක අංශවල හැඟීම් ගෝඨාභය අවදි කලේය. පලමු වටයේදීම දේශීය විදේශීය ප්‍රතිගාමී බලපෑම්වලින් ගොඨාභය අධෛර්ය කිරීමට සියලු උත්සාහයන් ගනු ලැබීය. කොළඹ හමුදා මූලස්ථානයට කඩාවැදී හමුදාපති පොන්සේකා අවසන් කිරීමට එල්ල කළ ගැබිනි බෝම්බයෙන් දරුනු තුවාල ලබමින් යුද්ධ හමුදා නායකයා බේරුනේ අනුනවයෙනි.

ගෝඨාභය අවසන් කරන ඊලඟ සැලසුම ක්‍රියාත්මක වූයේ පිත්තල හන්දියේ ප්‍රහාරයෙන්ය. ඔහුගේ ආරක්ෂක සැලසුම් මෙන්ම දෛවයෙන් ලැබුණු ඉඩකඩින් ත්‍රස්තවාදීන්ගේ ඉලක්කය වැරදී ගියේය. එතැන් පටන් අවසන් ජයග්‍රහනය දක්වා සියලු අංශ ඒකාබද්ධව හසුරා ගනිමින් වික්‍රමාන්විත ජයග්‍රහණය දක්වා සටන මෙහෙයවූයේ සිවිල් නිලධාරියෙක් ලෙස කටයුතු කළ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාය.

විජයග්‍රහනයෙන් පසු ඔහු කිසිදු තනතුරු හෝ වෙනත් වරප්‍රසාදයක් ඉල්ලා නොසිටියේය. යුද්ධයෙන් පසුව මහින්ද ජනපති ඔහුව තවදුරටත් කැඳවූයේ බිඳවැටුනු දේශය යලි ගොඩනැගීමේ කඩිනම් වැඩකටයුතු සඳහාය. අපිළිවෙල කුණුගොඩ ගැසුනු අපිරිසිදුව පැවති කොළඹ නගරය හා කෝට්ටේ අගනුවර දකුණු ආසියාවේ ආකර්ශනීය පුරවරයක් බවට පත් කලේ පොදු ජනතාවට නිදහසේ ගැවසිය හැකි සක්මන් මාවත්, සුවපහසු පෙදෙස් රාශියක්ද ඉදිකරමිනි. ආරක්ෂක මුලස්ථානය, නාගරික සංවර්ධනය ඇතුලු බොහෝ දැවැන්ත ඉදිකිරීම්වල පිටුපස සිටි යෝධයා වූයේ ගොඨාභයයි. ඔහුගේ වික්‍රමාන්විත ජයග්‍රහන ගැන අත්දැකීම් ඇති, නිදහස් අධ්‍යාපනයෙන් බිහිවූ තරුණ උගත් බුද්ධිමත් පරපුර අදත් ඔහුව පෙරට ගෙනඒමට කැපවූ මුලික පිරිස වී තිබේ.

යූ.ඇන්.පි. හොර මුල පන්නා දමා රට ගලවා ගැනීමේ දෙවෙනි මෙහෙයුමට කාලය පැමිණ තිබේ. හිටපු ජනපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ නව පිවිසුමක අපේක්ෂකයා ලෙස දෙවෙනි ගමනකට ගෝඨාභය වරම් ලබා ඇත්තේ වෙනත් නායකයින් නැති නිසා නොවේ.

ජනතාවගේ විශ්වාසවන්තයෙක් මෙන්ම, බලලෝභී නොවෙමින් දැක්වූ නිහතමානී බවත්, ප්‍රජාතන්ත්‍රය සුරකින, ජාතික ආරක්ෂාවට මුල්තැන දෙන, වේගවත් සංවර්ධන මාවතකට ඉඩකඩ සලසන, නවලිබරල්වාදය පිටුදකින, දේශීය සංවර්ධන මාවතක් ඔසේසේ ජන ජීවිතය නැංවීමට පොරොන්දු වන, අධිරාජ්‍යවාදයට යටත් කර ගත නොහැකි ශක්තිමත් නායකයා ගොඨාභය බව අවිවාදිතය.

මෙවර ජනාධිපතිවරණ සටනේ ඔහුගේ අහලකටවත් පැමිණිය හැකි වෙනත් කිසිදු අපේක්ෂකයෙක් පෙනෙන්නට නැත. ජනතාවට ඉතිරිව ඇත්තේ ගෝඨාභය පෙරට ගෙන, එක හුස්මට ජයග්‍රහණය කරා ඔසවාගෙන දිවයාමයි. පොදු ජනතාවගේ ප්‍රාර්ථනය ඉටු කර ගැනීමටත්, ජාතික නිදහස සුරක්ෂිත කර ගැනීමටත් ඇති එකම මාවත වන්නේ ගෝඨාභය ජනාධිපති කරවීමේ දෙවෙනි ගමනට උරදීමය.

# කියුබානු සහයෝගිතා 9 වෙනි ආසියානු පැසිපික් සමුළුව නේපාලයේදී




නේපාලයේ කත්මණ්ඩු නුවරදී 2019 ජූලි 26-27 දිනයන්හිදී ආසියානු පැසිපික් කලාපයේ රටවල් 16ක 150කට ආසන්න නියෝජිත පිරිසක් සහභාගී වූහ. ප්‍රධාන සැසියන්ට දේශීය නියෝජිතයන් සියයක් පමණද එක්විය.

කොමියුනිස්ට්වරු පාර්ලිමේන්තු බලය අත්පත් කර ගෙන පැවතුනත් මෙම සමුළුව කිසිදු රාජ්‍ය අනුග්‍රහයක් නොමැතිව සිදුවිය. මෙම සමුළුවට සහභාගී වූ නේපාල දේශපාලන නියෝජිතයින් සියලු දෙනාම වර්තමාන රජයේ නිල තනතුරු දරන්නන් නොවුනි. හිටපු ජනාධිපතිවරයෙක් වූ ප්‍රචන්ඩා සහෝදරයාද විවෘත කිරීමේ සැසියේ නිල කථිකයා ලෙස සහභාගී විය. දෙවෙනි සැසියේදී නේපාල කොමියුනිස්ට් පක්ෂය අත්පත් කර ගත් ජයග්‍රහනයන් හා එම වැඩපිලිවෙල හිටපු විදේශ අමාත්‍යවරයා විසින් දීර්ඝව කරුණු ඉදිරිපත් කරන ලදි. අවසාන සැසිය නේපාලයේ හිටපු අගමැති ප්‍රසාද් කුමාර් නේපාල් මහතා විසින් ඉතා අලංකාර යෙදුම් සහිතව සරල බසින් ජනතාවගේ ජයග්‍රහණය සඳහා පක්ෂය දීර්ඝ කලක් තිස්සේ ගෙන ගිය අරගලයේ විවිධ ස්වරූපයන් පෙන්නුම් කලේය.

රාජාණ්ඩුව පෙරලා දැමීමේ අරගලය ඔහු හැඳින්වූයේ ප්‍රජාතන්ත්‍රය දිනාගැනීමේ මුල් පියවර ලෙසය, ඉන් පසුව පැවති පාර්ලිමේන්තු පාලන සමය හැඳින්වූයේ අර්ධ ප්‍රජාතන්ත්‍රවාදයක් දිනා ගැනීමේ ආරම්භයක් ලෙසය, ඉන් පසුව ප්‍රබල කොමියුනිස්ට් පක්ෂ දෙක එක්සත් කර ප්‍රධාන වාමාංශික බලයක් බවට රටතුල පරිවර්තනය කර ගෙන නව ව්‍යවස්ථාවක් සම්මත කර සියලු සභාවල ජනතා නියෝජිතයින් 783ක් ජයග්‍රහනය කර පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී රජයක් පිහිටවූ බව දැන්වීය. නව ව්‍යවස්ථාවෙන් පසුව පැවති ඡන්ද වලදී නියෝජිතයින් 523 දෙනෙක් ඒකාබද්ධ කොමියුනිස්ට් පක්ෂයට දිනාගත හැකිවූ ඇති අතර, පළාත් පාලන ආයතන සියල්ලේම පාහේ බලය ඔවුන්ගේ බලපෑමට නතුවී තිබේ. එබැවින් එය ආසියානු කලාපයටම අලුත් අත්දැකීමක් එක් කළ ජයග්‍රහනයක් බවද කියා සිටියේය. ඒ නිසා නේපාල ජනතාව නිදහස සමරන දිනයක් නොමැති අතර, ඔවුන්ගේ ජයග්‍රහණයේ දිනය වන්නේ පූර්ණ ප්‍රජාතන්ත්‍රය දිනාගත් නව ව්‍යවස්ථාව සම්මත කර ගනු ලැබූ දිනය බවද ප්‍රසාද් කුමාර් සහෝදරයා පෙන්වා දුන්නේය.

කියුබාවේ සිට නියෝජිතයින් 4 දෙනෙක් සහභාගී වූ අතර, එයින් කියුබානු වීරයෙක් වූ පාර්ලිමේන්තු මන්ත්‍රී හා කියුබානු සහයෝගිතා ආයතනයේ සභාපතිවරයා වන ෆර්නැන්ඩො ගොන්සාලෙස් යන අයගේ දේශනයේදී, කියුබානු විප්ලවය රැක ගැනීමට සිදු කළ කටුක අරගලය හා වසර 15ක් ඇමරිකානු සිරකරුවෙක් ලෙස විඳි චිත්ත පීඩාවන් හා දුක්ගැහැට විස්තරය කලේය. විශේෂයෙන් නවලිබරල්වාදයේ බලපෑම කියුබාවට එල්ල වෙමින් ඇති අතර එයට මුහුණ දීමත්, ට්‍රම්ප් පාලනයේ සම්බාධක නිසා ආර්ථිකයට බාධා එල්ල වෙමින් පවතින බව පෙන්නුම් කලේය. විශේෂයෙන්ම අත්‍යාවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය, ඉන්ධන ගෙන ඒම හා ජාත්‍යන්තර මූල්‍ය බාධකයන් නිසා සංවර්ධන ඉලක්කයන්ට බලපෑම් සිදුවේ. නමුත් ඒ කිසිවකටත් යටත් නොවී කියුබානු ජනතාව විප්ලවයේ ජීව ගුණය ආරක්ෂා කර ගනිමින් කටයුතු කරන බව ඔහු පෙන්නා දුන්නේය. කියුබානු විප්ලවයේ නායකයෙක් වූ චේගුවේරාගේ දියණියක වන ඇල්ඩා ගුවේරා මහත්මිය තම දේශනයේදී චේගුවේරා සහෝදරයාගේ ජීවන අත්දැකීම් හා ළදරු විප්ලවකාරී කියුබානු ආණ්ඩුව රැක ගැනීම සඳහා ආසියානු රටවල් රාශියක කළ සංචාරයන්ද ඉන්දියාව, ලංකාව චිනය ආදී රටවලදී නායකයින්ගෙන් ලැබුණු හරසරද ඓතිහාසික පිංතූරද ඉදිරිපත් කරමින් පැහැදිලි කර දෙන ලදි.

මෙම සමුළුවට වැඩිම ජාත්‍යන්තර නියෝජිත පිරිසක් සහභාගී වූයේ ඉන්දියාවේ විවිධ ප්‍රාන්තවලිනි. ඔවුන්ගේ නියෝජිත සංඛ්‍යාව 35කි. දෙවෙනියට වැඩිම නියෝජිත පිරිස වූ 10 දෙනෙකු ලංකාවෙන් සහභාගී විය. ඇමරිකාවේ Socialist Workers' Party ලෙස නියෝජිතයින් 3 දෙනෙක් සහභාගී වූ අතර. ඔවුන් සහෝදර පක්ෂ නියෝජිතයින් ලෙස නවසීලන්තය, ඔස්ට්‍රේලියාව යන රටවලින්ද එක්විය. අවසන් ප්‍රකාශය සැකසීමේදී ''ඇමරිකානු අධිරාජ්‍යවාදය'' යන කොටස ඉවත්කර ''අධිරාජ්‍යවාදය'' ලෙස යොදන ලෙස නියොජිත පිරිසක් ඉල්ලා සිටියත් ලංකාවේ හා ඉන්දියානු නියෝජිතයින්ගේ මැදිහත්වීමෙන් එම අදහස ක්‍රියාත්මක නොවුනි.

සමුළුවෙන් පසු දින දෙකක කාලයක් රැදී සිටිමින් ලංකාවි නියෝජිතයන් ලුම්බිනි සංචාරයේ යෙදුනු අතර, නේපාලයේ ලංකාරාමය විහාරය වර්තමාන රජයේ සැලකිල්ලක් නොදැක්විම නිසා අයහපත් තත්වයට පත්වෙමින් තිබෙන බව එහි වැඩවසන වාද්දුවේ චන්ද්‍රරතන හිමිගේ දැනුම්දීම ලංකික නියෝජිත පිරිසගේ අවධානයට ලක්කෙරුනි.

\- තිලක් -



# යහපාලන නායකයෝ එකිනෙකා ගැටෙති

**කාලගුණය කුපිත වෙමින් තිබේ. ලෝකය හුස්ම ගන්නා පෙනහැල්ල වූ ඇමසන් වනාන්තරය ගිනි ගෙන සියලු ස්වභාවික සම්පත් දැවී අලුවී ගොසින්ය. නව ලිබරල් ආර්ථිකයත් සමඟ ඉඩම් වලට පවතින ඉල්ලුම සපුරාලීම සඳහා බ්‍රසීලයේ දක්ෂිනාංශික පාලකයින්ගේ ක්‍රියාකලාපය මෙයට හේතුවී තිබේ. එය මනුෂ්‍ය සංහතියේ පැවැත්ම තර්ජනයට ලක් කළ අපරාධයක් බව යුරෝපයේ පරිසර විද්වතුන්ගේ අදහසයි. මේ වනවිට ඇමසන් වනාත්තරයට හිමිකම් කියන අවට රටවල් 7ක් එක්වී ඇමසන් වනාන්තරය රැක ගැනීම පොදු සම්මුතියක් අත්සන් කර ඇත. නව ලිබරල්වාදය පරිසරය සමඟ කෙරන යුද්ධයට දරුණු ප්‍රතිප්‍රහාරයන් පසුගිය දිනවල සොබා දහමෙන් එල්ල වෙමින් තිබේ. මෑතකදී බහමාස්වලට බලපෑ කුණාටුව නිසා එම දූපත මුලුමනින්ම කසල ගොඩක් බවට පත් කර ඇත. මේ වන විට උතුරු කොරියාව හරහා හමා යන චන්ඩ මාරුතයත්, පිලිපීනයේ භූමි කම්පාවත් මිනිස් සංහතියට අවවාදාත්මක දැනුම් දී සිදු කරමින් තිබේ. ලංකාවට ඊසාන දින මෝසමේ බලපෑම සක්‍රිය වෙමින් පවතින අතර වස් පිංකම් හා පෙරහැරවල් පැවැත්වෙමින් තිබේ. දූෂිත ඇමතියෙක් සිදු කළ කරඬු වැඩවම්මකින් පසුව කෝට්ටේ පෙරහැරේ අලි කුලප්පුවක් සිදුවී කිහිප දෙනෙක් බරපතල තුවාල ලබා රෝහල් ගතකර ඇත. පරිසර කැලඹීම් මෙන්ම දේශපාලන බිමේද අලි කුලප්පුව නිසා පාලක පැලැන්තිය භිතියකට පත්ව ජනතාව නොසන්සුන්ව සිටි.**

## ජනාධිපතිවරණයට යූ.ඇන්.පී.යෙන් කවුද?

යහපාලනය පළාත් පාලන ඡන්දයෙන් පසු දෙදරා යාමත් සමඟ දිනෙන් දිනම යූ.ඇන්.පි.යත් එහි වැඩපිළිවෙලත් අර්බුදයට ගමන් කරමින් තිබේ. විශේෂයෙන් බටහිර උවමනා අනුව වත්තම් කර ගත් යූ.ඇන්.පී. ආණ්ඩුව යලි පිහිටුවීමට අගමැතිකම රනිල්ට බාරදීම වෙනුවෙන් ජනාධිපතිවරයා වෙත නොයෙකුත් ආකාරයෙන් කරුණු දැක්වූ බව මෑතකදී සජිත් ප්‍රේමදාස මහතා හෙලිදරව් කර තිබේ. රනිල්ට අගමැතිකම ලබාදී තමන් ඊලඟ ජනාධිපතිවරණයට ඉදිරිපත්වීම ගැන එදා ඇති වූ එකඟතාවය මෙදා රනිල් බිඳ දැමීම ගැන නියෝජ්‍ය නායක සජිත් ඇතුලු කණ්ඩායමක් කුපිත වී සිටී. එහෙත් යූ.ඇන්.පී. හිතැති ධන කුවේරයන්ගේ එකඟතාවය තවමත් ලැබී නොමැති බැවින් ව්‍යාපාරියෙක් වන කථානායක කරු ජයසූරිය මහතා ඉහල පැලැන්තියට පිලිගත හැකි නායකයා ලෙස නම් කරන මෙන් ඉල්ලයි. මෙයින් ගැලවීමේ එක් මාවතක් වශයෙන් යූ.ඇන්.පි. නායකයා ලෙස තමන්ම ඡන්දයට පැමිණෙන බව රනිල් ප්‍රකාශ කරමින් සිටියි.

## සජිත් අභියෝග කරන්නේ කාටද?

ජනතාවගේ ජන ජීවිතය කඩා බිඳ දමා, රට සාගත තත්වයකට ඇද දමා, මහ බැංකුව ඇතුලු රාජ්‍ය සම්පත් කොල්ල කා, දුප්පත් ජනතාවගේ ඉඩකඩම්, ගේදොරද වෙලඳපොල තුල වාෂ්පවී යන ලෙස ජනතාවගේ බලපත්‍ර ඉඩම් විවෘත වෙළඳපොලට දැමීමට පියවර ගත්තේ මොවුන් සියලු දෙනාමය. ගැමි ගොවි ජනතාවගේ තරුණයින් අතරින් මතුවන පීඩනය සජිත්ට දැනෙමින් ඇත. ඔහු ජනපතිකම ඉල්ලා සිටින්නේ දුප්පතුන්ගේ ජන ජීවිතය සුබිත මුදිත කිරීමට බව කියයි. නමුත් යූ.ඇන්.පි.යේ ප්‍රතිපත්තිය වී තිබෙන්නේ ධනය හිමි පැලැන්තියේ ජීවිත සුබිත මුදිත කිරීම සඳහා ජනතාවගේ සම්පත්, ඔවුන්ගේ ලේ දහඩිය පමණක් නොව, දේශයේ ස්වභාවික සම්පත්ද ධනහිමියන්ට ඈඳාගැනීමට හැකි වන ලෙස රනිල් ක්‍රියාත්මක විය. නව ලිබරල් ආර්ථික පිලිවෙත එහි ධාවක යන්ත්‍රයයි. සජිත් ජනාධිපතිකම වෙනුවෙන් නව ලිබරල් ආර්ථිකය පිටු දකින බව කියයි. ඉහල පැලැන්තියේ පාලකයින් මහජන සම්පත් කොල්කකමින් ඔවුන්ගේ ව්‍යාපාර දියුණු කර ගැනීමට දේශපාලනය යොදා ගැනීම ගැන විවේචනය එලිපිට සිදු කරයි. එයින් පෙනී යන්නේ යූ.ඇන්.පි.ය තුලම පාලක පැලැන්තිය ඉහල පහල ලෙස බෙදී ඇති ආකාරයයි. විශේෂයෙන් රනිල් බටහිර විදේශ හමුදා රටතුලට වද්දා ගැනීමත්, බහුතර ජනතාවගේ ආගමට කෙනහැලිකම් කර, අන්‍යා ආගමික බලවේග මත යැපෙමින් සිදු කරණ විගඩම නිසා රටත් ජනතාවත් බේදුම්වාදයේ අනතුරට ලක්වීම ගැන සජිත්ට හිතවත් සංඝ පරම්පරාවේ බලපෑමද ඔහුවෙත එල්ලවෙමින් තිබේ. එනිසා සජිත් මහතා ඉදිරියට තැබූ අඩිය සෙන්ටිමීටරයක්වත් පිටුපසට නොගන්නා බව කියමින් රනිල්ට අභියෝග කරයි.

## ගෝඨාභයගේ ජයග්‍රහනයේ ඉදිරිය

ඒකාබද්ධ විපක්ෂයේ ඒකමතිකත්වයෙන් ගෝඨාභය මහතා ජනාධිපතිවරණ අපේක්ෂකයා ලෙස නම් කිරීම නිසා යූ.ඇන්.පි.යට විරුද්ධව ජයග්‍රහනය කල හැකි ප්‍රබල අපේක්ෂකයා ඔහු බව හැම පැත්තෙන්ම ලැබෙන ජනතා ප්‍රතිචාරයෙන් පෙන්නුම් කරයි. විශේෂයෙන් යූ.ඇන්.පි.යේ දෙගිඩියාවේ වාසිය ගලා යන්නේ ගොඨාභය වෙතය.

දැනට ජ.වි.පෙ.යෙන් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයා වහසිබස් දොඩමින් සිටියත් ඔහුට ගමන් කළ හැක්කේ සීමිත ඡන්ද සංඛ්‍යාවකට පමණය. කිසිසේත් දිනිය නොහැකි අයෙක් වෙත ඡන්ද බලය අපතේ යැවීමට ජනතාව අවසානයේ කැමැත්තක් නොදක්වනු ඇත. යූ.ඇන්.පි.යෙන් ගැලවෙන ඡන්ද අල්ලා ගැනීමට ජ.වි.පෙ. ඇටවූ ඡන්ද කෙමනට අවසානයේ අසුවන්නේ නන්නත්තාරව සිටින සුංගන් රැලක් පමණි.

ගෝඨාභයගේ ජයග්‍රහණය පහසු කර ගැනීමට උතුරු නැගෙනහිර පළාත්වල දෙමළ මුස්ලිම් ඡන්දය උපරිම ලෙස ලබා ගැනීමටත්, කළුකරය හා කොළඹ නගරයේ ව්‍යාපාරිකයින්ගේ හැසිරීමත් විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුව ඇත.

එමෙන්ම ජනපති සිරිසේන කුමණ ආකාරයේ පියවරකට තල්ලුවී යනවාද යන ගැටළුව තවම ලිහී නැත. පොහොට්ටු නායකයින්ට ජනපති සිරිසේන විහිලුවක් ලෙස පෙනුනත් ඔහුගේ විධායක බලය තිබෙනතාක් කල් ඔහු ගන්නා පියවරයන් ඡන්දයට සෘජු ලෙස බලපානු ලැබේ. එනිසා පොහොට්ටු සාකච්ඡා පසෙක දමා ජනාධිපති අපේක්ෂක හා ඒකාබද්ධ විපක්ෂ එක්වී එකඟතා මාවතකට වහා එළඹිය යුතුව ඇත. එය නායක මහින්දගේ මෙන්ම අපේක්ෂක ගෝඨාභයගේ වගකීමක් ලෙද දිනෙන් දින පත්වේ.

## ශ්‍රී ල.නි.ප. සැරසෙන්නේ කුමකටද?

මෛත්‍රිපාලට යූ.ඇන්.පී. නායකයාගේ සැබෑ උවමනාව පෙනෙන්නට පටන් ගත්තේ ටිකෙන් ටිකය. විජාතිකයෙක් මහබැංකු අධිපතිකමට පත් කිරීමට ජනාධිපතිවරයා විරුද්ධ වුවත් සිංගප්පූරු සිහින මාලිගා දෙව්ලොව ගැන මැවූ රනිල්ගේ රසකථාවල මීබිඳු කන්වල තවරාගත් ශ්‍රී ල.නි.ප. ඇමතිවරුන් සියලු දෙනා ගජමිතුරන්ට යටත් විය. සිරිසේන ජනපති උඩ විසිවී ගියේ මහබැංකුව කොල්ලකෑ බව හෙලිවීමෙන් පසුවය. මීට වඩා පහසුවෙන් ඒ දිනවලම රනිල් අවසන් කර රට ගලවා ගැනීමට ජනපති හා ශ්‍රී ල.නි.ප.යට ඉඩ තිබුණි. නමුත් මහින්ද විරෝධය ඊට හරස් විය. ශ්‍රී ල.නි.ප.ය පොදු ජන බලවේගයේ නායකයා වීමේ දෙවෙනි උත්සාහයට ඉඩ ගැනීමක් ලෙස මහමැතිවරණයේදී මහින්ද රවටා සිරිසේන කඩුව දුන්නේ යූ.ඇන්.පි.යේ වැද්දාගේ අතටය.

පළාත් පාලන ඡන්දයෙන් ශ්‍රී ල.නි.ප. පරාජයත් පොහොට්ටුවේ නැඟ ඒමත් නිසා ජනපති අන්දුං කුන්දුං විය. එයින් පසු යූ.ඇන්.පි.ය සමඟ බැඳී ප්‍රේමය කෝපයක් බවට පත්වී දෙදරා ගියේය. එතැන් පටන් යූ.ඇන්.පි. පෙරමුණු ආණ්ඩුව සාගරය මැද අතර මං වූ පහුරක් ලෙස විදේශ ආධාර මත යැපුණි. ජනපති - අගමැති බේදය සහරාන්ගේ බෝම්බයත් සමග පක්ෂ ඇතුලත පුපුරා ගියේය. ඒ සමගම යූ.ඇන්.පි.ය කම්බ හොරුන්ගේ ගුබ්බෑයමක් පමණක් නොව ත්‍රස්තවාදීන්ගේ ලැගුම් හලක් බවටද සිරිසේන ජනපතිට තේරුම් යන විට ශ්‍රී ල.නි.ප. මන්ත්‍රිවරුන් සමහරක් ගැලවී පොහොට්ටුවටත්, යූ.ඇන්.පි.යටත් ඇතුලු විය.

ශ්‍රී ල.නි.ප.- පො.ජ.පෙ. සාකච්ඡා අවසන් නොකර, පොහොට්ටුවේ සමුළු පවත්වා ජනාධිපතිවරණ අපේක්ෂකයාද, මහින්ද නායකයා බවටද පත් කර තනි ගමනකට සැරසීම නිසා ශ්‍රී ල.නි.ප.ය තවදුරටත් අපහසුතාවයට පත්විය. යූ.ඇන්.පි.යේ නායකත්වය බෙදීයාමේ දිසාවත් සමඟ රනිල් රැකගැනීමේ පාර්ශවයට ශ්‍රී ල.නි.ප. මන්ත්‍රිවරුන් පිරිසක්ද සැරසී ඇති බව පෙනේ.

නව ලිබරල්වාදයේ සිහින මාලිගා හා සිංගප්පූරු බූරු සංකල්පය ඔස්සේ යූ.ඇන්.පී.-ශ්‍රී ල.නි.ප. හවුල දැමූ යහපාලන වෙට්ටුව නිසා රටත් ජනතාවත් විනාශ මුඛයට ඇදවැටුනි. විදේශ ගිවිසුම් රැසක් හා බටහිර ණය වලල්ලට කොටුවී සිරකාර රටක් බවට ලංකාවත් ජනතාවත් පත් විය.

## අගමැති රනිල්ගේ හා ජනපති සිරිසේනගේ කස්තිරම්

විපක්ෂ බලවේග ආණ්ඩුව අල්ලා ගත්තොත් රනිල් ඇතුලු ගජ මිතුරු හොරු රැලට නැවතීමට සිදු වන්නේ විපක්ෂ නායක නිල නිවසේ නොව හිර ගෙදරය. ඔහු ඡන්දයට පැමිණෙන බව කියන්නේ ජනාධිපති මුක්තියේ බලයෙන් යුක්තිය පිටුදැකීමටය.

ජනපති සිරිසේන අර්ජුන මහෙන්ද්‍රන් ගෙන්වා ගැනීමට ලියවිලි අත්සන් කිරීමෙන් පමණක් නොනැවතී අනෙකුත් හොරුන් උසාවි කූඩුවට නැංවීමටද කටයුතු කරන බව පෙනේ. සජිත් ඉදිරියට ගැනීමට ජනපති සිරිසේනගේ තල්ලුව ලැබෙන්නේ යූ.ඇන්.පී. බලපවුර දෙදරවා හැරීමටය. මේ දිනවල පවතින රනිල් - සජිත් සාකච්ඡා නයි - මුගටි සටනක්ය.

පලමුව රනිල් ජනාධිපතිවරණයට ඉදිරිපත් වී ජයග්‍රණයෙන් පසුව සජිත් අගමැති ලෙස පත් කිරීමට යෝජනා කරයි. එහෙත් සජිත් පාර්ශවය යෝජනා කරන්නේ පලමුව තමා ජනාධිපතිවරණයට පැමිණෙනවා නම් පක්ෂය එකට තබා ගෙන රනිල් අගමැති තනතුර ලබා ගැනීම සඳහා ජයග්‍රහනයෙන් පසුව රනිල්ට අගමැතිකම භාර දිය හැකි බවය. යූ.ඇන්.පී. නායකයින් දෙපොල එකතැන කැරකෙන්නේ ඇලඩින් සහ පුදුම පහන කථාව නැවත සිහිගන්වමිනි.

## ජනතා ප්‍රජතන්ත්‍රයට ලැබෙන ඉඩකඩ.

1978 ව්‍යවස්ථාවට අනුකූලව පත්වූ ජනාධිපතිවරයා ඔහුගේ දැනුවත්කම හා ජනතාවගේ උවමනාව අනුව 19 වෙනි ව්‍යවස්ථාවෙන් ජනමත විචාරණයකින් මෙපිට ඇති සියලු බලතල ඉවත් කරගෙන ඇත. ජනපති සිරිසේන හොඳහිතින් සිදු කළ දෙය අද වනවිට ඔහුගේම හිසමත කඩාවැටී තිබේ. එය රනිල්ගේ තවත් කොස්පට්ටා ගැටයක් බව මහින්ද-සිරිසේන දෙදෙනාම පිලිගෙන හමාරය. මේ නිසා රාජ්‍ය යන්ත්‍රණය අවුල් විය. ආර්ථිකය බිඳවැටුනි. රුපියල කඩාවැටීම නැවතීමට ජගතෙක් නැත. විදේශිකයින් දූපතේ කැබලි අත්පත් කරගනියි. සංස්කෘතිය, ආගම් විනාශයි. වැසියන් අනාථයි. එනිසා සිරිසේන ජනපති අන්තිම සටනට සැරසී සිටී. ජනතා ප්‍රජාතන්ත්‍රවාදයේ සමතුලිත බව පවත්වා ගැන්මට සම්ප්‍රදායික සම්මුතිය බිඳවැටී ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය ගමන් කරන්නේ එකිනෙකට හරස්වය. එබැවින් ඡන්දය හා ප්‍රජාතන්ත්‍රය ආරක්ෂා කරන්නට ගොස් සිරිසේන ජනපති දෙවරක් අධිකරණය ඉදිරියේ පසුබැස්මට ලක් විය. ඔහුට පක්ෂයෙන් බලකරන්නේ තව වරක් අන්තිම තුරුම්ප්පුව එනම් ඔහුගේ ධූරකාලය අවසන්වීමේ දින වකවානුව අධිකරණයෙන් විමසන ලෙසය.

මෛත්‍රී ජනාධිපතිවරයා මේ මොහොතේ හෝ කලයුත්තේ, ඉතිහාසයේ අම්හිරි තැන් පසෙකට දමා, ශ්‍රී ල.නි.ප.යේ තවමත් ඉතිරිවී සිටින ප්‍රබුද්ධයින්ද එක් කර ගෙන යූ.ඇන්.පි.ය හා නව ලිබරල්වාදය පරාජය කිරීමත් ජාතික සංහිදියාවත් පෙරදැරි කර ගෙන ජනතාව ගොනුවෙමින් සිටින හරිමග කඳවුරට පියවර මැනීමය.

**සිරිසුමන විදානපතිරන**
**2019-09-10**

# 2020 ජනාධිපතිව

# ජනතාව අවුලවා රට වනස

## ඒ.ජා.ප. යේ ඩීල්වලට අපි නෑ



දයාසිරි ජයසේකර
ලේකම් -ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

කැමැත්තෙන් හෝ අකමැත්තෙන් අපට පිළිගන්න සිදුවෙලා තියෙනවා පොදු ජන පෙරමුණ කියන්නේ ජන බලය තියෙන පක්ෂයක් කියලා. ඒ වගේම ඒ අය සමග අප දේශපාලනීක සහයෝගිකතා හා සහෝදර පක්ෂ සමඟ හොඳින් ගණුදෙනු කරලා තියෙනවා. ඒ හින්දා අපි ඉදිරි ජනාධිපතිවරනයේ ඔවුන් සමඟ සාකච්ඡා කරමින් සිටිනවා.

අපටත් අපේක්ෂයෙක් නම් කරන්න පුළුවනි. නමුත් දිණුම පැරදුම පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා ඒ නිසා අපි ඒ ජයග්‍රාහී අපේක්ෂකයා රටේ ගැටලු විසඳා ගත හැකි අපේක්ෂකයා ලෙස සලකා අපි ඉදිරි තීන්දුව ගන්නවා. එක්සත් ජාතික පක්ෂයත් සමඟ අපට කිසිම සම්බන්ධයක් නෑ. කොහොමවත් අපි එක්සත් ජාතික පක්ෂයත් එක්ක ඩීල් වලට එන්නේ නැහැ.

**කුමාර වෙල්ගම මැතිතුමා සමඟ තිබෙන ගණුදෙනුව කුමක් ද?**.

එතුමා තාම අපේ පක්ෂයට සම්බන්ධ වී නෑ එතුමා එක්සත් ජාතික පකෂයේ වැඩපිළිවෙලකයි ඉන්නේ එහෙම කෙනෙක් අපිට විශ්වාස නැහැ. අනික එයා පොදු ජන පෙරමුණ විවේචනයට තබාගෙනයි ඉන්නේ. ශ්‍රී ලංකා කඳවුරේ ප්‍රතිපත්ති එකක් එක්සත් ජාතික පකෂයේ වැඩපිළිවෙල වෙන එකක් ඒ නිසා එතුමාගේ ඩීල් වලට අපි එකඟ වෙන්නේ නැහැ. කොහොමත් එයා අපිට සම්බන්ධ නොවීම අපට සතුටක් .

**එතකොට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා සජිත් ප්‍රේමදාස ඇමතිතුමා අතර තිබෙන ගනුදෙනුව කුමක්ද?**

සජිත් ප්‍රේමදාස මැතිතුමා කැබිනට් ඇමතිවරයෙක් හැටියට තමයි ජනාධිපතිවරයා හා කටයුතු කරන්නේ. එහෙම වුනා කියලා ජනාධිපති අපේක්ෂකයෙක් හා ගනුදෙනු කිරිමක් හැටියට ඒක දකින එක වැරදියි. ඔහු තාම ජනාධිපති අපේක්ෂකයා ලෙසවත් නම්කොට නෑ.

පසුගිය කාල වකවානු වල පුද්ගල නිදහස, මාධ්‍ය නිදහස වෙනුවෙන් නිර්ලෝභීව වැඩකල කෙනෙක් තමයි අපේ ජනාධිපතිතුමා. එතුමා ප්‍රජාතන්ත්‍රවාදය නියමාකාරයෙන් රැකගත්තා. එතුමා ගන්නා නිවැරදි තීන්දුව මත පක්ෂයක් වශයෙන් අපි පොදුවේ ජනාධිපති අපේක්ෂකයා තෝරාගන්නවා.

## සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ රට අනාථ කරන ඩීල්

දින 100 සංකල්පය කියලා යහපාලනය, ලිච්චවී පාලනය කියලා අලංකාර දේශපාලන වචනවලින් රට නන්නත්තාර කර අගමැති , ජනපති අද මූණට මූණ බලන්නැතිව රට වනසලා හමාරයි. ඔවුන්ගේ සියලු ප්‍රකාශ පට්ටපල් බොරු වලට වහල තමයි 2015 බලයට ආවේ. ඒ අතරින් මෙරටට විච්ච බරපතලම දේ තමයි සිවිල් සමාජය කියලා දේශපාලන දාරාව ඇතුවිත් ජනතාවාදි දේශපාලනයෙන් තොර මෙරටේ පැවති සිවිල් සමාජය ක්‍රියාකාරීත්වය සිවිල් සමාජ ක්‍රියාගත දේශපාලඥයින් විසින් එහි අර්ථකතනය පවා විනාශ කරමින් රට විනාශ කිරීමට ඉදිරිපත් වීම. මෙහිදී ඔවුන් විසින් ඇති කරන ලද ව්‍යාපාරය ලංසු දැමූ සූදුවක් වුණා. ඔවුන්ගේ දේශපාලන ඕනෑඑපාකම් තුළ තමයි මේ රජයත් ක්‍රියාත්මක වුණේ. ඔවුන් ඉදිරියේදීත් එවැනි ක්‍රියාවකට මුල පුරමින් සිටිනවා.



ආචාර්ය
චරිත හේරත්

පසුගිය ආණ්ඩුවේ වැරදි තිබෙන්න ඇති. ඒ අඩුපාඩු හොයනවට වඩා සිවිල් සමාජ රට නිවැරදි මඟට ගන්නවාට වඩා ඔවුන්ගේ න්‍යාය පත්‍රයේ කාරණා ඉටු කිරීමට තමයි උත්සුක වුණේ. ඒකට හොඳම උදාහරණය තමා මහ බැංකු මංකොල්ලය ඔය කියන සිවිල් සමාජ ක්‍රියාකාරියින් හෝ යහපාලනය පිළිබඳ කතා කළ කිසිදු බුද්ධිමතකු මහ බැංකු මංකොල්ලය පිළිබඳව කිසිදු විවේචනයක යෙදුනේ නැහැ. ඔවුන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය කොතනැකදැයි හොඳින් පැහැදිලි වෙනවා. ඒ වගේම එකී සිවිල් සමාජ විසින් ලංකාවේ නියම සිවිල් සමාජ පුරවැසියන් විනාශ කොටගෙන තමයි පැමිණ තිබෙන්නේ. එය ඉදිරි ජනාධිපතිවරනයේදීත් මීට වඩා පුළුල්ව දැකගත හැකි වෙනවා. ඔවුන්ගේ ලංසුව හෝ ඩීල් එක මැනවින් ඉදිරියේදී දකින්නට පුළුවනි.

## ඇමරිකා - බටහිර අධිරාජ්‍යවාදී මෙහෙයුම ඩීල්එකක්

2015 ආණ්ඩුකරණයේ නැවත ප්‍රතිනිර්මාණය කිරීමට ඉදිරි ජනාධිපතිවරණයේදී මොවුන් සූදානම් වේ. 2015 ආණ්ඩුව ගෙදර යැව්වේ 2002 දී ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් වලින් හදපු පිඹුරුපත් අනුවයි. නැවත එය ප්‍රතිනිර්මාණය කිරිමට ඔවුන් බලාගෙන ඉන්නවා. අගමැති රනිල් වික්‍රමසිංහ කියන විදියට පසුගිය අවුරුදු 5 තුළ ඔවුන් බඩගාගෙන ඇවිත් තියෙනවා. ඒ අර ඇමරිකානු ප්‍රතිපත්තිය ගෙනයාමට. රටට ඇතුල්වීම, රටතුළ කඳවුරු පැවැත්ම, කළාපීය වශයෙන් ඇමරිකාවේ බලය තහවුරු කිරිමට ඇමරිකාව අදටත් ලංකාව තෝරාගෙන ඉන්නවා. ඔවුන්ගේ ක්‍රියාවලිය හරහා චීන රජය සමග ලංකාවේ තිබෙන සබඳතා බිඳීමට අවශ්‍ය වන මූලික කාරණාව වන මහින්ද රාජපක්ෂ මහතා පරාජය කිරීම අදටත් මූලික කොටගෙන සිටිනවා.එය වාචිකවත්, ලිඛිතවත් ඔවුන් විසින් ප්‍රකාශ කොටතිබෙනවා.

ඇමරිකාව විසින් මේ රට බෙදා



වෛද්‍ය වසන්ත බණ්ඩාර
ප්‍රධාන ලේකම් - දේ.හි.ජ. ව්‍යාපාරය

වෙන්කරගැනීමේ ක්‍රියාවලියට තමා සූදානම් වන්නේ.

සූඩානය බෙදා වෙන්කළ කාරණයම කාබන් කොපිය තමයි අපට දීලා තියෙන්නේ. එමනිසා ඔවුන් නැවත වරක් පරණ ක්‍රමවේදය අළුත් විදියට අත්හදා බලයි. සෙලවෙන ඡන්ද ඉලක්ක කරගෙන මූල්‍ය විදිහටත්, මානසික විදිහටත් ඔවුන්ගේ මේ ඉදිරි ඡන්ද ව්‍යාපාරය සැලසුම් කරාවි. මහින්ද රාජපක්ෂ කඳවුර පරාජය කිරීමට ඔවුන් විසින් නොයෙකුත් ක්‍රමවේද අත්හදා බලයි. මීට පෙර සරත් ෆොන්සේකා මහතා පොදු අපේක්ෂකයා ලෙස ඉදිරිපත් කර පසුව මෛත්‍රීපාල සිරිසේන මහතා ඉදිරිපත් කලේත් මහින්ද රාජපක්ෂ මහතා හා එම කඳවුර පරාජය කිරීමට පොදු අපේක්ෂක සංකල්පය පාවිච්චිකල නිසාය.

පොදු අපේක්ෂක සංකල්පය මෙවරත් ඔවුන් ගෙන ඒම ස්ථිරයි. ගෝඨාභය රාජපක්ෂ මහතා එක්සත් ජාතික පක්ෂ ප්‍රමුඛ ජනතා විමුක්ති පෙරමුණ හා අනෙකුත් විරුද්ධවාදීන්ට හතුරෙකු ලෙස පෙනුනද අපේ කඳවුරේ හතුරාලෙස රනිල් වික්‍රමසිංහ මහතා හෝ නම්කරන පොදු අපේක්ෂකයා හතුරෙකු ලෙස අප දකින්න නෑ. අපේ ප්‍රභල තම හතුරා වන්නේ ඇමරිකාව ප්‍රමුඛ බටහිර අධිරාජ්‍ය වාදයයි. මේ රෑකඩ පොදු අපේක්ෂකයා ඉදිරිපත්කොට ඒකට ඔවුන් උපාය මාර්ග පාවිච්චි කරනවා. අධිෂ්ඨානය කලා වගේ පක්ෂයක කෙනෙක් හෝ කීප දෙනෙක් නිර්පාක්ෂික අපේක්ෂකයා ලෙස ඔවුන් ඉදිරිපත් කොට ඇමරිකාව විසින් සහයෝගය ලබාදෙන අපේක්ෂකයාට ඔවුන්ගේ සහයෝගය ලබා දේවි. එසේ වන්නේ තවමත් ඇමෙරිකාවේ ව්‍යාපෘතිය ඉවර නැති නිසයි.

ඇමරිකාවේ විශ්ලේෂකයෙක් කියනවා ගිලිවිය නොහැකි ඇමරිකාවේ නැව ශ්‍රී ලංකාව කියලා. ආසියා ෆැසිපික් කලාපයේ ඔවුන්ගේ යුධ නෞකාව ලංකාව හැටියටයි ඔවුන් සලකන්නේ. දැන් ජනාධිපති කියන විදිහටත් අගමැති තමා මේ රටේ බලවත්. ඒනිසා රනිල් වික්‍රමසිංහ මහතා බලනවා නැවත අගමැති වෙන්න.

• අධිරාජ්‍යවාදීන්
• ජනතා විමුක්
• පොදු අපේ
• ඒ.ජා.පෙ. ප

ජනාධිපති අපේක්ෂකයා නොවෙයි ඔවුන්ට දැන් වැදගත්.

ජනතා විමුක්ති පෙරමුණ ඔවුන්ගේ පොදු අපේක්ෂක සංකල්පය අතහැර නොමැති බවක් පේනවා. එය බොහෝවිට එක්සත් ජාතික පෙරමුණේ පොදු අපේක්ෂකයාගේ සහයෝගය පතා වැඩකරන බවක් පේන්නේ. මේ නිසා ජනතා විමුක්ති පෙරමුණේ පහල සාමාජිකයන් විසින් ප්‍රබල විවේචනයක යෙදී තිබෙනවා. ආයෙත් පොදු අපේක්ෂකයෙකු වුවමනා නැතිබව ඔවුන්ගේ අදහස. කොහොම නමුත් සාමාජික අදහස්වලදී නායකත්වයට තම මතය අකුලා ගන්න සිදුවෙයි. ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය පොදු අපේක්ෂක සංකල්පය භෞතිස්ම කරන්න සාමාජිකයා මෙල්ල කරගෙන ඉටුකරන්න බලාගෙන ඉන්නවා. පසුගිය කාල වකවානුවල සිදුකළා වගේම අවසානයේ ඔවුන් ජනාධිපති තරඟයෙන් ඉවත්වේවි. මේක තමයි ඇමරිකාව විසින් කරගෙන යන ගේම් එක. පසුගිය කාල වකවානුද රනිල් වික්‍රමසිංහ අපේක්ෂකත්වය පරිත්‍යාග කලා වගේ සජිත් ප්‍රේමදාස මහතාටත් තම අපේක්ෂකත්වය පරිත්‍යාග කරන්න වේවි. එතකොට ඔහුට පක්ෂව කතාකරන අයට ඔහුගේ බෝධිසත්ව ගුණය ගැන වර්ණනා කරන්න සිදුවේවි. අනුර කුමාර දිසානායක මහතාට පොදු අපේක්ෂකයා භෞතිස්ම කිරිමේ සදාචාර බලයක් ලැබේවි.

## අපට තියෙන්නේ සජිත් ඩීල්එක විතරයි.

අපෙන් ඉදිරිපත් කරන අපේක්ෂකයා වෙන කවුරුත් නොවෙයි. අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔහුට වෙනම ඩීල් නැහැ. එම ඩීල් අවශ්‍යත් නැහැ. එක්සත් ජාතික පක්ෂයේ අර්බුද නැහැ. අපේ නායකත්වය සුදුසු වෙලාවට නිවැරදිව සජිත් ප්‍රේමදාස ඇමතිවරයා නම්කරයි. එහෙම වුනා කියලා අපේ පක්ෂය දෙකඩ වෙන්නේ නැහැ. ජ්‍යෙෂ්ඨයින්ගේ මතය තමයි වැදගත් වෙන්නේ. ඒවගේම එක්සත් ජාතික පෙරමුණේ නායකයින් වන රිෂාඩ් බදුර්දීන්, පාඨලී චම්පික රණවක, මනෝ ගනේෂන්, හකීම්, වැනි

# රණයේදී

# න්න දමන ඩීල්

## සමග ඇතිකර ගත් ඩීල්
## ති පෙරමුණේ ඩීල්
## ක්ෂකත්වයට දමන ඩීල්
## ක්ෂ අතර ඩීල්



අමාත්‍ය, ආචාර්ය
හර්ෂ ද සිල්වා



විජිත හේරත්
ප්‍රචාරක ලේකම්- ජනතා විමුක්ති පෙරමුණ

නායකයින් සජිත් ප්‍රේමදාස මැතිතුමා ජනාධිපති අපේක්ෂකයා කරගන්න සූදානමින් ඉන්නවා. රනිල් වික්‍රම සිංහ මැතිතුමා ගේ නායකත්වයෙන් රනිල් - සජිත් සුසංයෝගයෙන් ජනාධිපති අපේක්ෂකයා නම්කොට අපි ජනපති තරගයට එනවා.

### ජ.වි.පෙ. සිවිල් සංවිධාන ඩීල්

අපි අපේ හොඳම බුලට් එක ඉදිරිපත්කරනවා. රටම ඉල්ලන අපේක්ෂකයා. ඒ අනුර කුමාර දිසානායක සහෝදරයා. අපි අපේ ජනබලවේගය ගොඩනගලා ඉවරයි. විශේෂයෙන් සිවිල් සංවිධාන හරහා අපි බලවත් වෙලා ඉන්නවා. ඒ අය අද මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති කරපු එකට දුක්වෙනවා. ඒ වගේම දහනවවෙනි සංශෝධනය අනුව මීලඟ ජනාධිපතිවරයාට අමාත්‍යාංශයක්වත් දරන්නට බෑ. බලයක් නැති ජනාධිපතිවරයෙක් තමයි පත්වෙන්නේ. ඊලඟට පත්වන පාර්ලිමේන්තුව ශක්තිමත් කරන්න තමයි අපි උත්සහ කරන්නේ.

අගමැති රනිල් වික්‍රමසිංහ මහතා දැන් කියනවා විධායක ජනාධිපතිවරණය අහෝසි කරනවා කියලා. ඕනෑම දේශපාලන තත්වයක් තුළ ජනාධිපති කම අහෝසි කරන්න අපි පසුබට වෙන්නේ නෑ. මේදෙගොල්ලෝම දාලා තියෙන්නේ ඩීල් එකක්. ඒ ඩීල් එක තමයි හැමෝම හොරකම් කිරීම. ඒවගේම හොරු අල්ලන්න ආව අයත්, හොරු එලවන්න ආව අයත් අපේ බලයකදී වැරදිකරුවන් කරන්න තමයි බලාපොරොත්තුව. ඔවුන්ගේ ඩීල් පරාජය කරන්න තමයි අපි ඉදිරියට ආවේ. අපි අපේ රටේ ජනතාව වෙනුවෙන් ඉදිරිපත් වන්නේ ඒ අයගේ අයිතිවාසිකම් වෙනුවෙන්.

අධිරාජ්‍යවාදීන්ගේ න්‍යායපත්‍රයට උනත් හොඳයම් දෙයක් තියෙනවා නම් අපි ඒවත් ක්‍රියාත්මක කරනවා. සමරිසි අයිතිය වගේ දේවලට අපි විරුද්ධ නැහැ. ඒ වගේ අයිතිවෙනුවෙන් උනත් අපි පෙනීසිටිනවා. සමහරු කියනවා අපි අපේ අපේක්ෂකයා ඉවත්කර ගනී කියලා. අපි අපේ මතවාදයේ දිගටම ඉන්නවා.



සාකච්ඡාව - ජනබන්දු සේනානායක



## පාර්ලිමේන්තුවෙන්

# රටට අහිතකර ගිවිසුම් එපා...

**අගොස්තු 09 වන දින පාර්ලිමේන්තුව කල්තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිරකරමින් පා.ම. වාසුදේව නානායක්කාර සහෝදරයා සිදුකරන ලද කථාව.**

ACSA ගිවිසුම 2007 අත්සන් කල බව අපි දන්නවා. නැවත මේ ආණ්ඩුව 2017දී අත්සන් කරපු ACSA ගිවිසුම මගින් ඇමරිකාවට වුවමනා යුදමය ක්‍රියාදාම වලට සහයෝගය පළ කරන්න, ඒවාට වුවමනා සැපයුම් කරන්න, ඒ වුවමනා කරන ඉඩකඩ ලබාදෙන්න මේ රටේ අපි කෙලින්ම බැඳී සිටිනවා.

ඇමරිකා එක්සත් ජනපද රාජ්‍යය මේ කලාපයේ යම්කිසි යුද ක්‍රියාකාරීත්වයකට යනකොට අපට සිද්ධවෙනවා ඒකට උදවුකාරයන් වෙන්න. ඒ සඳහා තිබුණු අතිරේක ගිවිසුමක වුවමනාව තමුන්නාන්සේලා දැන් සම්පූර්ණයෙන්ම Skip කරලා තිබෙනවා. ඒ වෙනුවට arrangements කියලා දාලා තිබෙනවා.

පසුගිය කාලෙ අපි දැක්කා USS Johan C. Stennis කියන ප්‍රහාරක යානා සහිත නෞකාවක් අපේ රටේ ත්‍රිකුණාමලයට එපිට මුහුදේ නවතා තිබුණ බව. ඒකෙන් ගුවන්යානා ආවා කටුනායකට, ඇමරිකා එක්සත්ජනපදයට අයිති යම්කිසි ප්‍රදේශයක සිට කටුනායකට ආවා. transport aircraft. ඒවායින් භාණ්ඩ බෑවා. ඒ භාණ්ඩ පරීක්ෂාවකින් තොරව USS John C. Stennis යුද නෞකාවෙ ඉදලා කටුනායකට පැමිණි ගුවන්යානා වලට පැටෙවුවා. ඒ භාණ්ඩ ගුවන් යානා වලට පටවලා යුද නෞකාව අරගෙන ගියා. ඒක වුණේ 2017 තමුන්නාන්සෙලා අත්සන් කරපු මේ ගිවිසුම අනුව.

සාගරයේ තිබුණු ඔවුන්ගේ යුද නෞකාවක්, ඔවුන්ට වුවමනා කරණ පහසුකම් ලබාදීමට ලංකාවේ කටුනායකට ගෙනඑනු ලැබ. පරීක්ෂාවකින් තොරව යම් යම් භාණ්ඩ තවත් ගුවන්යානා වලට පටවලා අරගන යන්නට අපි අපේ භූමිය ලබාදී තිබෙනවා.

මේ ගිවිසුම අනුව අපේ භූමිය, අපේ සාගරය, අපේ මුහුදු තීරය, අපේ වරාය මේ ඔක්කෝම දෙන්න බැදිලා තිබෙනවා, ඇමරිකා එක්සත් ජනපදයේ යුද මෙහෙයුම් වලට. අපි දන්නවා රාජ්‍යක අවසාන බලය හමුදා බලය බව. රාජ්‍ය බලය තිබෙන්නේ හමුදා බලය තුලයි. අපේ රටේ ස්වෛරීභාවයත්, රාජ්‍ය බලයත් තිබෙන්නේ හමුදා බලය තුලයි. ඒ හමුදා බලයෙන් තමයි අපි එල්.ටී.ටී. එක පරාජය කලේ. ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ල මර්ධණය කලේ. ඒ මොකද? ජනතා විමුක්ති පෙරමුණේ කැරැල්ල මතුකලේ තවත් රාජ්‍ය බලයක අභියෝගයක්. එල්.ටී.ටී. එක මතුකලෙත් රාජ්‍ය බලයක අභියෝගයක් ඒ රාජ්‍ය බලයේ අභියෝගය අපේ රාජ්‍ය හමුදා මගින් පරාජය කළා. මර්දනය කළා. තවත් රාජ්‍යයක හමුදාවකට මේ රටේ ගැවසෙන්න ඉඩ දුන්නොත් අපේ රටේ රාජ්‍ය බලයට කුමක් වන්නේද?

SOFA ගිවිසුමේ වගන්ති තමුන්නාන්සෙලා හෙළි කරලා නැහැ. අපේ රටේ නීතියට යටත් නැතිව රාජ්‍ය හමුදාවක් මේ රටේ නිදහසේ ගැවසෙන්න පටන් ගත්තොත්, අර ජපානයේ ඔකිනාවා වල සිදුවෙමින් තිබෙනවා වගේ අපේ රටේ රාජ්‍ය බලයට කුමක්ද වෙන්නෙ? එතකොට අපේ රාජ්‍ය බලය හකුලාගන්න වෙනවා. අපේ රාජ්‍ය නිදහස ඒ තරමට හකුලාගන්න වෙනවා.

මෙවැනි පාවාදීමක්, මෙවැනි දේශද්‍රෝහී කියාවක් තමුන්නාන්සෙලා SOFA ගිවිසුම මගින්, MCC ගිවිසුම මගින් කරගෙන ඉදිරියට ගියොත් මේ රට අපට අහිමි වෙනවා. මේ රට යටත් විජිතයක් වෙනවා. එසේ වීමට ඉඩදීලා මේ රටේ ජනතාව නිකන් බලාගන ඉන්නෙ නැහැ. තමුන්නාන්සෙලාට 2015 දි දුන්නාවූ බලය දැන් කම්මුතුයි. දැන් ඒ බලය ගෙවිලා ගිහිල්ලා. තමුන්නාන්සෙලා එදා මේ රටේ ජනතාවට දුන්නා වූ ප්‍රතිඥාවලට පටහැනිව මේ රටේ ජාතික නිදහස , මේ රටේ ස්වෛරී බලය පාවාදෙන මෙවැනි ක්‍රියාදාමයකට තමුන්නාන්සෙලා අවතීරණ වීමත් සමග, පසුගිය පළාත් පාලන ඡන්දයෙන් ඇස් අරවන ආකාරයට තමුන්නාන්සෙලාගේ legitimacy එක ඉවරයි. තමුන්නාන්සෙලාට ආණ්ඩුවක් හැටියට තිබුනු නීත්‍යානුකූල යුක්තිසහගත බලය ඉවරයි. ඒ නිසා තමුන්නාන්සෙලාය අද ඉතිරිවී තිබෙන්නේ මේ කෙටි කාලය තුල මේ රටේ දේපොලත් පාවා දීලා, ජාතික නිදහසත් පාවාදීලා රිදී ටිකක් හොයාගන්නයි යන්නේ.

ඩොලර් මිලියන 480 කට තිබෙන ගිජුකම කෑදරකම උඩ මේ රටේ භූමිය, මේ රටේ ජනතාවගේ ඉඩකඩම්, මේ රටේ ජනතාවගේ හිමිකම් ආදී මේ සියල්ලම එක පොදියට බැදලා ඇමරිකානු බලයකට යටත් කරන්න තමුන්නාන්සෙලා ඉඩ දෙනවා නම්, තමුන්නාන්සේලාට දියයුතු දඬුවම ලබාදෙන බව අමතක කරන්න එපා.

මේ ආණ්ඩුබලය පරාජය වීම වලක්වන්න තමුන්නාන්සෙලා කුමන්ත්‍රනකාරී ලෙස ක්‍රියාකරන බව පාස්කු ප්‍රහාරයත් එක්ක අපට හෙලි වුණා. ඒ සම්බන්දයෙන් කරන ඇතැම් පරීක්ෂණ යට ගහලා තියෙනවා. ඒ සම්බන්දයෙන් පාර්ලිමේනතුවේ පවත්වාගෙන යන ඊනියා කමිටුවෙන් තමුන්නානසේලා එක එක පුද්ගලයන්ට සුදුහුනු ගානවා.

මේ රට සුද්දන්ගෙ පාලනය යටතේ තිබෙන කාලයේ සුද්දො ලෝක යුද්ධයක පැටලුණු නිසා අපේ රටේ වරායවල් වලට, අපේ රටේ භූමියට බෝම්බ දැමීමක් සිදු වුනා. ඒ අතීතය කරා නැවත වරක් මේ රට ගෙනයාමට තමුන්නාන්සෙලා මේ වාරයේ ඇමරිකානු රජයේ බලය මේ රට ඇතුලට වද්දාගෙන මේ රට ඇමරිකාවේ ගුබ්බෑයමක් බවට පත්කිරීමට ගෙනයන්නා වූ මේ ව්‍යායාමය වැලැක්වීමට අපට කළ හැකි හැමදෙයක්ම සිදුකරන බව තමුන්නාන්සෙලාට අනතුරු හැගවීමක් හැටියට කිව යුතුව තිබෙනවා.

**සරත් රණසිංහ**

# මීළඟ ජනාධිපති අගමැති ඒකාබද්ධවූ බලයක් ගොඩනැඟේද?



රට ආර්ථික වශයෙන් උගුලකට හසුවී ඔත්පල වී සිටී. මේ බිහිසුනුකම වසන්කොට සමහර දේශපාලකයින් රටේ අරුමය ලියා ගැනීමේ බල පොරයක නියැලී සිටී.

අතිවිශාල ධනස්කන්දයක් වැයකර දිනකට කෝටි 4.5 ක පිරිවැයක් දැරියයුතු ජනාධිපතිවරයෙකු බිහිකර ගැනීම වෙනුවට විධායක ජනාධිපති දූරය අහෝසිකොට පාර්ලිමේනතුවේ මහජය නියෝජිත බලය නැවත ස්ථාපිත විය යුතු නොවේද?

බලය ඩැහැගැනීම සඳහා බහුතර ජනයා රැවටීමට කරන වාචාලකථා ඇරුණුකොට අර්ථවත් ජනහිතකාමී වැඩපිලිවෙලක් දක්ෂිනාංශික කදවුරෙන් ඔබ අසා දැක තිබේද?

අද උදෑසන හැමදාම කොළ බෙදන ගමේ අන්ඩපාල ගැන්සිය අපේ ගෙදරට ප්‍රචාරක පත්‍රිකා අඩවැඩියාවක් දීගොස් තිබුණි. එය කියවූ මට ඇතිවූයේ රටවැසියන් වෘෂභ පෝතකයන් ලෙස සලකා 21 වන සියවසේදීත් මෙරට දක්ෂිනාංශික දේශපාලකයින් ජනතාව ඇන්දීමට සැරසෙන බවයි. බලය හැරුනුකොට කිසිදු අරමුණක් දැක්මක් මෙරට දක්ෂිනාංශික දේශපාලන පෝරිසාදයින්ට නැතිබව මේ කුණු කූඩයට හිමි පත්‍රිකාවට ප්‍රමාණවත්ය.

ප්‍රේමදාස මහතාගෙන් පසුව බලයට පැමිණි සියලු ජනාධිපතිවරු කියා සිටියේ විධායක ජනාධිපති ධූරය අහෝසි කරන බවත්, බලය සියතට ගත්පසු කිසිදු ජනාධිපතිවරයෙකු එකී පොරොන්දුව ඉටුනොකල සේම විධායක බලය තව තවත් ශක්තිමත් කොටගෙන පවත්වාගෙන යනු දුටුවෙමු. ඉදිරි ජානාධිපතිවරණයේදී බිහිවන ජනාධිපතිවරයා සතු බලය කොතෙක්ද? යන්න විග්‍රහකිරීම මෙම ලිපියේ අරමුණයි. මෙය මේ මොහොතේ සමාජගත කලයුතු ප්‍රබල දේශපාලන දැක්මකි.

## දෙපා බිදුනු අශ්වයෙකු පිට නැගි අසරුවෙක්ද?

19 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිට හිමි විධායක බලය යම් දුරකට අහෝසිකොට එම බලය පාර්ලිමේන්තුවට හා කැබිනට් මණ්ඩලයට පවරා ජනාධිපතිවරයා අඩු බල සහිත බවට පත්කර තිබේ.

එබදු ජනාධිපතිවරයෙකු මුළු රටම එකම ඡන්ද කොට්ඨාශයක් ලෙස සලකා අතිවිශාල ධනස්කන්දයක් වැයකර පත්කර ගැනීමට අවශ්‍යවන්නේ කුමක් සඳහාද? දෙපා බිදුනු අශ්වයෙකු පිට නැගි ජොකියෙකුට කලහැක්කේ කසපටිය වැනීම පමණි.

## නාමමාත්‍රික ජනාධිපති

මීලග ජනාධිපතිවරයාට ඇති බලයේ ප්‍රමාණය ගැන අවබෝධයක් රටේ ඡන්ද දායකයාට තිබිය යුතුය. සිහිබුද්ධියෙන් බලය දකින කවරෙකුට වුවත්, තේරුම්ගත හැකි අන්තර්ගතයක් 19 වැන් ව්‍යවස්ථා සංශෝධනය තුල ඇතුලත්වී තිබේ.

ජනාධිපතිවරණය ජයගැනීමෙන් පසු රට ගොඩගැනීමට තමන් සතු හැකියාව හා වැඩපිලිවෙල ගැන පවසන අනාගත ජනාධිපතිවරටයකුට ක්‍රියාත්මක විය හැකි වන්නේ අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය සමග පමනි. උගතුන් කීපදෙනෙකුගෙන් අයෙකු ලෙස ප්‍රකට ආචාර්ය නිහාල් ජයවික්‍රම මහතා විසින් ජූනි 10 දා මීලග ජනාධිපතිවරයාට හිමි බලතල පිලිබද පැහැදිලි විග්‍රහයක් ඉදිරිපත්කර තිබුණි. 19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව ඔහු පෙන්වා දී ඇත්තේ මීලග ජනාධිපතිවරයා විලියම් ගොපල්ලව පන්නයේ ජනාධිපතිවරයෙකුගේ තත්වයට හෝ ඊට පෙර සිටි ආණ්ඩුකාරවරයෙකුගේ තත්වයට සමාන බවය. එහෙත් මෙය සම්පූර්න සත්‍යය නොවේ. ඊලග ජනාධිපතිවරයා සිටියද ඇතිවන්නේ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයකි. ඊට පසුව ක්‍රියාත්මක වන්නේ ජනාධිපතිගේ සහ පාර්ලිමේන්තුවේ බලයකි.

## ජනාධිපතිගේ බලය ගිලිහීම

19 වන ව්‍යවස්ථා සංශෝධනයේ 42වන වගන්තියට අනුව ආණ්ඩුවේ බලය මෙහෙයවීම බාරවන්නේ ජනාධිපතිවරයාට නොව, අගමැති ඇතුළු අමාතය මණ්ඩලයටය. එතෙක් විධායක බලය සතුවූයේ ජනාධිපතිවරයාටය. මේ අනුව මීලගට පත්වන ජනාධිපතිවරයා සහ අගමැති ඇතුළු ඇමති මණ්ඩලය සමග බලය බෙදාගැනීමක් සිදුකල යුතුය. දැනට අගමැති හා ජනපති අතර තිබෙන ගැටුමෙන් මෙය පැහැදිලි වේ.

## ජනතාවට කොලේ වසා ගැසීම

මීලගට පත්වන ජනාධිපතිවරයාගේ යථාතත්වය ඡන්දදායකයාට, රටවැසියාට අවබෝධකර දීමට වඩා සත්‍ය වසන්කොට කොලේ වසා අපේක්ෂකයින් ජනාධිපතිවරනයට ප්‍රවේශවී ස්වයං මෝහනටය පත්ව සිටීද? ඉදිරියේදී පවත්වන පාර්ලිමේනතු මැතිවරණයකදි පත්වන අගමැති ප්‍රමුඛ ආණ්ඩුව සමග සහයෝගයෙන් ජනාධිපතිවරයා ලෙස ක්‍රියාකරනවා හැර ඉන් ඔබ්බට යා නොහැක.

දැනට රටතුල පවතින දේශපාලන ආර්ථික හා සම්පත් අර්බුදය ජනාධිපතිවරණයේදී මේ සමාජය දැවීකරනයවී මතුවන තීන්දුවක් බවට පත්විය හැකි ගතියක් විද්‍යාමාන වෙමින් පවතී.

මෙරට දේශපාලනය ලෝක අධිරාජ්‍යවාදී බලයේ අභියෝගයට මුහුනදිය යුතුය. ලාංකික ඡන්ද දායකයන්ට කිවයුතුව ඇත්තේ නොයෙක් නවීන වෙස් මුහුණු කාරයින්ට රැවටී අධිරාජ්‍යවාදයට ගොදුරු නොවන ලෙසටය.

1917 ඔක්තෝම්බර් විප්ලවයට පෙර ලෙනින් සහොදරයා විසින් කලයුත්තේ කුමක්ද කෘතියේ සදහන්කර ඇති පරිදි අපි මේ සමාජයේ කසල ශෝදකයින් නොවේ. මේ සමාජය වෙනස්කිරීමට සූදානම් මිනිසුන් වෙමු. ඒ සඳහා අද ඇති කාර්යය අදිනද හෙටට නියමිත කාර්යය හෙවත් ඉටුකිරීමට සැරසිය යුතුය.



ප්‍රවීන මාධ්‍යවේදී
**ටිකිරි දිසානායක**

# කවි සිතුවිලි

## වයති අලි වාඩියේ මළ බෙර

අකුරැස්සේ රණගල සමරසේන

ජනපති කරඬුවේ
දැපෙන වල් අලි මඬුවේ
බැදුණු මළ පුඬුවේ
කණකොකා මාතරදී ඇඬුවේ

රටම විකුණන වර
නිදන් බිම් වනසන පොර
ලැබ බෙලි කපන දුර
වයති අලි වාඩියෙහි මළ බෙර

අප්පගේ පිළිවෙත
පෙරළන පිරුණු බණ පොත
යළිත් අර සෑමත
නිවන් යන්නට වනනවද අත

තරගයට ජනපති
අස්වයෙක් හරියට නැති
යු එන් පියෙහි පති
හෙනහුරා මුළු රටට කෙළවති

බලකාමෙ කොල්ලෙට
රට කඩා විකිණිල්ලට
නහුතෙට ගැරිල්ලට
බලය දෙනවද අලි තුරුල්ලට

මළ බතට පේවුණු
අලි වාඩියට හාවුණු
මොන සන්දාන ගොනු
නියත ආවොත් අළු දූලිවනු

## කරුණාව

චණ්ඩ මාරුතයක්
අභිමුව වුව
ඇද වැටෙන
කවර නම්
එලයක් වුව
වැළඳ
සිප සනසා
සුරැකිව රැක
ගනුයේ නම්
සෙනෙහස
උතුරායන
කඳුලින් තෙත්වූ
දයාබර
මිහි මවම පමනි

**හිඳගල**
**මංගල විජේසිංහ**

# වියට්නාමයේ වේගවත්ම ආර්ථික වර්ධනයක්

**තානාපතිනිය පෑම් තිබිච් එන්ගුක්**




සමාජවාදී වියට්නාම් ජනරජයේ 74 වෙනි ජාතික දින සැමරුම පසුගිය 12 වෙනිදා රත්නපුර තැපැල් ශ්‍රවනාගාරයේදී හිටපු මහඇමති අශෝක ජයවර්ධන මැතිතුමාගේ මුලසුනින් පැවැත්විනි. ජාතික ධජය සබරගමු ආණ්ඩුකාර ධම්ම දිසානායක මැතිතුමා අතින්ද වියට්නාම් ධජය තානාපතිතුමිය අතින්ද නැංවීම සිදුවිය.

වියට්නාම් තානාපතිතුමිය අදහස් දක්වමින් කියා සිටියේ දීර්ඝ කාලීන යුද්ධ ජයග්‍රහනයකින් පසුව ලෝකය ඉදිරියේ බලවත්ව නැගී සිටීමට සමාජවාදී වියට්නාම් ජනරජයට හැකි වූ බවය.

විශේෂයෙන් කෘෂිකර්මාන්තය පදනම්ව ජාතික ආර්ථික ශක්තිමත් වූ අතර සහල් අපනයන කරන රටවල් අතරින් ප්‍රධාන තැනක් වියට්නාමය අත්පත් කර ගෙන තිබේ. එසේම ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනු වලදී සැලකිය යුතු වර්ධනයක් ලබා ගත හැකිවීම නිසා වියට්නාම් ජනතාවගේ ජීවන තත්වය උසස් මට්ටමකට ගෙනඒමට හැකි වූ බවත්, දුගීභාවය මුලුමනින්ම තුරන් කිරීමට හැකි වූ බවත් එතුමිය ප්‍රකාශ කලාය.

සමාජවාදී වියට්නාම් ජනරජයේ 74 වෙනි ජාතික දින සැමරුම උත්කර්ෂවත් ආකාරයෙන් පැවැත්වීමට ශ්‍රී ලංකා වියට්නාම් සහයෝගිතා සංගමය කටයුතු කිරීම ගැන ස්තුතිය පල කලේය.

එම දේශනයේ සිංහල පරිවර්තනය ප්‍ර.වා.පෙ. දිස්ත්‍රික් ලේකම් කීර්තිරත්න සහෝදරයා විසින් සිදු කරන ලදි.

මෙම උත්සවයේදී වාමාංශික පක්ෂවල සුභපැතුම්, ඩිව් ගුණසේකර, මහාචාර්ය තිස්ස විතාරණ, පාර්ලිමේන්තු මන්ත්‍රි වාසුදේව නානායක්කාර යන සහෝදරවරුන් විසින් සිදු කරන ලද අතර, ආණ්ඩුකාර ධම්ම දිසානායක මහතා හා වියට්නාම් සහයෝගිතා සංගමයේ ප්‍රධාන ලේකම් එස්.සුදසිංහ සහෝදරයාද අදහස් දැක්වීය. හිටපු පළාත් සභා මන්ත්‍රිවරුන් ලෙස නමින්ද අනුරප්‍රිය, දීපාල් ගුණසේකර, ජයසුන්දර යන සහෝදරවරුද ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරුද මෙම උත්සවට සහභාගී වූහ.

# අපේ ජාතික සම්පත් තවමත් බ්‍රිතාන්‍යයේ

හියුනෙවිල් නැමති බ්‍රිතාන්‍ය නිලධාරියා මෙරටින් ගෙන ගිය පුස්කොල පොත් නැවත ගෙන්වා ගැනීම සඳහා කටයුතු කළ යුතු බව විදේශ කටයුතු අමාත්‍ය, තිලක් මාරපන ඇමතිතුමා වෙත පාර්ලිමේන්තු මන්ත්‍රි වාසුදේව නානායක්කාර සහෝදරයා දන්වා යවා ඇති බව වාර්තාවේ.

යටත් විජිත සමයේ ගෙනගිය එම පුස්කොල පොත් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ Nevilles collection of ola scripts වශයෙන් තැන්පත් කොට ඇති බව දක්වයි. අප රටට අයත් මෙම වටිනා ලේඛන නැවත ගෙන්වා ගැනීමට වහාම පියවර ගතයුතුව ඇත.

# බෙහෙත් මිල අධිකයි සෞඛ්‍ය ඇමති නිදිවදිනවා ද?

මේ දිනවල බෙහෙත් මිල අධික ලෙස ඉහල යෑමට පටන් ගෙන ඇත. බෙහෙත්මිල අඩුකර ඇති බවට සෞඛ්‍ය ඇමතිවරයා වහසිබස් දෙඩුවත් බෙහෙත් මිළ ගැන දන්නේ වෙළෙන්ඳා හා රෝගියාය.

දරුවෙකුගේ මන්ද මානසික තත්ත්වයක් සඳහා මිලදී ගන්නා බෙහෙත් සඳහා මසකට රු. 13000/- වැය වන අතර, ගැස්ට්‍රයිටිස් රෝගයට වෙනදා මසකට වැයවූ රු. 800/-ක මුදල එම ඖෂධය සඳහාම දැන්වන විට රු. 1500/- වී ඇතැයි රෝගියෙකු වාසුදේව නානායක්කාර මන්ත්‍රීවරයාට දන්වා ඇතිබව සැලවේ.

සෞඛ්‍ය ඇමතිවරයා මේ ගැන නොදැන සිටිනවාද එසේත් නොමැති නම් නොදන්නා ආකාරයෙන් නිදිවදිනවා ද යන ප්‍රශ්ණය මතුවී තිබේ. දුප්පත් රෝගි ජනතාව රජයේ රෝහල්වල බෙහෙත් හිඟය නිසා තමන් වියදම් දරා එම බෙහෙත් වර්ග පුද්ගලික ඖෂධ ශාලාවලින් ලබා ගත්නා අතර මිල ඉහලයාම නිසා බෙහෙත් නොමැතිව රෝගීන් මියයාමේ තර්ජනයකට ලක් වී තිබේ.

# ගෝලීය උනුසුම පිලිබඳ දකුණු ආසියානු සමුළුව හයිද්රාබාද්හිදී

කාර්මික විප්ලවයෙන් පසුව ඇති වූ සංවර්ධන ක්‍රියාවලියේදී ගෝලීය උනුසුම ඉහලයාමට පොසිල ඉන්ධන භාවිතයත්, කැලෑ එලිපෙහෙලි කිරීමත් ප්‍රධාන හේතු බව විද්‍යාඥයින්ගේ මතය වී තිබේ. විශේෂයෙන් ගෝලීය උණුසුම නිසා හිමාලය ආශ්‍රිත ගැලැසියර් අයිස්තට්ටු දියවී යමින් මුහුදු ජලය ඉහල යාම පසුගිය වසර 25 තුල සීඝ්‍රයෙන් සිදුවිය. එය සියලු දූපත් රාජ්‍යයන්ට තර්ජනයක් වී ඇත.

මෙම තර්ජනයට වහාම පිලියම් සෙවිය නොහැකි වුවොත් 2100 වන විට මාලදිවයින ගිලියන අතර, පකිස්ථානය, බංගලදේශ මෙන්ම ලංකාවේද බොහෝ ප්‍රදේශ මුහුදට යටවීයාම වැලැක්විය නොහැකි අතර කාලගුණික අනාථයින් දස දහස් ගණනින් ඉහල යමින් අවට රටවලටද ප්‍රශ්ණයක් වන බව පරිසර විද්‍යාඥයියෝ කරුණු දක්වති.

මේ පිලිබඳව සමාජයේ සියලු අංශයන්ගේ සහභාගිත්වයෙන් යුතුවද, දකුණු ආසියානු කලාපයේ නියෝජිතයින්ද එක්වී සංවිධානය කෙරෙන හයිද්රාබාද් සමුළුවට, ලංකාවෙන්ද නියෝජිත පිරිසක් සහභාගීවීමට නියමිතය.

ල.ස.ස.ප නායක මහාචාර්ය තිස්ස විතාරන සහෝදරයාද ප්‍ර.වා.පෙ. විධායක සභිකයන් වන කේ.ඩී.එස්. මහානාම හා සංජීව ධම්මික යන සහෝදරවරුන්ද මෙම සමුළුවට සහභාගී වීමට නියමිතය.

කාලගුණික වෙනස්වීම අවම කර ගැනීමට පියවර ගැනීම, ඒ පිලිබඳව තොරතුරු හුවමාරු කර ගැනීම, මහජනතාව දැනුවත් කිරීම හා දකුණු ආසියානු රාජ්‍යයන්හි ප්‍රතිපත්ති සම්පාදනයේදී ගෝලීය උනුසුම පිලිබඳව අවධානය යොමු කරවීම මෙම සමුළුවේ පරමාර්ථ වී ඇත. මේ සඳහා ගොවියන් කම්කරුවන් ව්‍යාපාරිකයන් ඇතුළු බහුජන ක්‍රියාකාරීන් එක්වීමට නියමිතය

# පාර්ලිමේන්තුවේ හොරිකඩයෙක් උඩුබුරලයි.

පසුගිය දිනක කම්කරු හා වෘත්තීය සබඳතා වැය ශීර්ෂ විවාදය අවස්ථාවේදී නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය විසින් පෙන්නා දුන් කරුණුද එම සංගමය බෙදා හරින ලද පත්‍රිකාවක තොරතුරුද ඉදිරිපත් කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රි වාසුදේව නානායක්කාර සහෝදරයා කරුනු දැක්වීම කරගෙන යද්දී එහි වැදුනු කම්කරු විරෝධී හොරිකඩයෙකුගෙන් දිගටම බාධා එල්ල වී ඇති බව වාර්තාවේ

හොරිකඩයාගේ උඩුබිරලීම් මධ්‍යයේ කරුණු දක්වමින් නිදහස් වෙළෙඳ කලාපයේ කළමනාකරණය පෞද්ගලික අංශයට ලබාදීමෙන් වන විනාශය පෙන්නා දෙනවිට හාම්පුතුන්ගේ කොන්ත්‍රාත්කරුවකු ලෙස හැසිරුනු එම යු. එන්. පී. හොරිකඩයාට අනෙකුත් මන්ත්‍රිවරුන්ගෙන්ද බලවත් විරෝධය එල්ල වී ඇති අතර, ඉදිරියේදී නිදහස් වෙළඳ කාලපයේ කම්කරුවන් යූ.ඇන්.පී. හොරිකඩයාටත් දුෂිත පාලකයින්ටත් හොඳ පාඩමක් උගන්වනු ඇත.

## චින්තනයේ යුග පෙරළියක් සිදුකල සොදුරු මිනිසා



**චින්තනයේ යුග පෙරළියක් සිදුකල මේ සොදුරු මිනිසා භෞතිකවාදය , මිත්‍යාවට එරෙහි අරගලයෙන් පොදු ජනතාවගේ අපේක්ෂාවන් හා ප්‍රර්ථනාවන් පෙරට ගෙනගිය විග්‍රහයෙත් , වාමාංශිකවාදී දෘෂ්ටියෙත් එකිනෙකට යාකරමින් දශක කිහිපයක් ජාතියට මගපෙන්වීය. අතිදක්ෂ වෛද්‍ය මහාචාර්යවරයෙක් වූ මොහු සමාජයේ දුප්පත්කමේ රෝගනිධනය අපට පෙනේවා දුන්හ. දුප්පත්කමින් මිදීමේ මාර්ගය ඔහුගේ විමර්ශනයෙන් අවදි කළහ. සමසමාජ උතුම් නායක පරපුරට කාලෝගේ නාමය එකතු වන්නේය...**

**ජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ සංවේගය භක්තිමත් ප්‍රණාමය !**

**වාසුදේව නානායක්කාර සහෝදරයා ඇතුළු මධ්‍යම කාරක සභාව**

## රාසික් සහෝදරයා අපෙන් වෙන්විය.



**ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණට යෝධ ශක්තියක් වූ රාසික් සහෝදරයා, අප පක්ෂයේ ඉහළම නායකත්වයට පත්වූයේ ඉතාම කෙටි කාලයකිනි. ඒ ඔහුට තිබූ සුවිශේෂී දක්ෂතාව හා බුද්ධි මහිමය නිසාමය. රාසික් සහෝදරයා මියයන විට ඔහු පක්ෂයේ මධ්‍යම කාරක සභාවේත්, විධායක සභාවේත්, විශේෂයෙන් පක්ෂයේ අධ්‍යාපන කමිටුවේ ලේකම් ලෙසත් කටයුතු කරමින් දේශපාලනයේ උන්නතිය වෙනුවෙන් සිදුකල මෙහෙය කිසිවෙකුට අමතක කළ නොහැක.**

**ඔහු රටේ ජාතික නිදහස වෙනුවෙන්ද, සිංහල, දෙමළ, මුස්ලිම් සමගිය වෙනුවෙන්ද පීඩිත වීදි කම්කරුවන්ගේ අයිතීන් වෙනුවෙන්ද පෙනී සිටිමින් සිදුකළ ක්‍රියාකාරී මැදිහත්වීම එම ක්ෂේත්‍රයේ සගයන්ට මෙන්ම අංකුර වෘත්තීය සමිති නායකයන්ටද මහත් ආදර්ශයක් විය.**

**මුස්ලිම් ජාතිකයකු ලෙස ඉපිද මරදාන සහිරා විදුහලෙන් සිංහල භාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරා, උසස්පෙළ විභාගයටද සමත්ව චතුර ලෙස සිංහල හා දෙමළ භාෂාවන් හැසිරවීමට හැකි වූ රාසික් සහෝදරයා ප්‍ර.වා.පෙ. අධ්‍යාපන ලේකම් ලෙස සිදුකල විශේෂ මෙහෙය අගය කළ යුතුය. විවිධ ක්ෂේත්‍රවල දස්කම් දැක්වූ රාසික් සහෝදරයා අපෙන් වෙන්වී යාම නොසිතූ මොහොතක සිදු විය.**

**ඔහුගේ අභාවය ගැන සොවින් තැවෙන දයාබර බිරිඳ දරුවන් හා දෙමව්පිය ඇතුළු නෑසිය හිතවතුන් සමඟ ප්‍ර.වා.පෙ. නායක පාර්ලිමේන්තු මන්ත්‍රි වාසුදේව සහෝදරයා සමඟ මධ්‍යම කාරක සභාවද ශක්තිය අපිද ශෝකය පලකරමු.**

# ශක්තියට ආධාර කරන්න

මූල්‍ය දුෂ්කරතා අභිබවමින් ශක්තිය මාස්පතා ඔබවෙත එවීමට අපි වෙහෙසෙමු. ශක්තිය පුවත්පත පවත්වාගෙන යාම වෙනුවෙන් ඔබ ලබාදෙන වාර්ෂික දායක මුදල් හා ආධාර නිතිපතා අපවෙත ලබාදෙන්න. ඔබගේ මුදල් වෙනුවෙන් රිසිට් පතක් නිකුත්කරනු ලැබේ. සියලු මුදල් පහත දැක්වෙන ආකාරයට එවන ලෙස ඉල්ලමු. මුදල් ඇණවුම් කුරුඳුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකි පරිදි එවන්න.

**එම්. බී. සරත් පත්මදාස , ශක්තිය කළමණාකරු,**

**49/1, විනයාලංකාර මාවත, කොළඹ 10**

ශක්තිය

## වසරකට විශ්‍රාමයන 25000ට කීදෙනෙක් ගන්නවාද?

රාජ්‍ය ගිණුම්කාරක සභාවේදී ප්‍රශ්නය මතුවේ

ගෝඨාභයගේ විජයග්‍රහනය හා ප්‍රගතිශීලී ජනතාවගේ කාර්යභාරය
සම්මන්ත්‍රණය සැප් - 22 සවස 3.30ට
වාද්දුව විජය කුමාරතුංග ශාලාවේදී
මුලසුන - වාසුදේව නානායක්කාර සහෝදරයා



# වැඩකරන ජනතා බලවේගය මහින්ද - ගෝඨාභය පෙරටුකර ගනී.

- සියළු ශ්‍රමිකයන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් හදුන්වාදීම
- පෞද්ගලීකරණය වහා අත්හිටුවීම හා රාජ්‍ය දේපල විකිණීම නැවැත්වීම
- වතුකරයේ වැඩකරන ජනතාවට අත්‍යාවශ්‍ය මූලික පහසුකම් සැපයීම

පසුගිය සැප්තැම්බර් 03 වන දින පස්වරුවේ වැඩකරන ජනතාවගේ බලසෙනග වෘත්තීය සමිති ඒකාබද්ධ බලමණ්ඩලයේ නායකත්වය යටතේ ජාත්‍යන්තර ප්‍රදර්ශන සම්මේලන ශාලාව තුල රොක් වෙද්දී ඔවුන්ගේ උද්යෝගයෙන් සබාගැබ නින්නාද වන්නට විය.

පන්දහසකට වැඩි සෙනගකින් ශාලාව පිරියද්දී, පසුබිමෙන් ඇසුනේ ශ්‍රම ශක්තිය අගය කරන ගීතාවලියක් සමග මුසුවූ අධිෂ්ඨානය දනවන සංගීත රාවයකි.

නොබෝ වේලාවකින් ශාලාව තුලට පිවිසි මහින්ද මැතිතුමා ශ්‍රී ලංකා පෙරපාසල් සංගමයේ නිලධාරිනයන් වන ශ්‍රියා මැන්ඩිස්, සමන්පානි මනම්පේරි සහෝදරියන්ගේ දෙපල සහ සමිති නිලධාරින් පිරිසක්ද, ගෝඨාභය මැතිතුමා පිලිගැනීම ප්‍රජාතන්ත්‍රවාදී දුම්රිය සේවක සමිතියේ සභාපති ප්‍රේමලාල් හා පළාත් පාලන සමිතියේ ජයලත් සහ ස්වයං රැකියා සමිති සහෝදරවරුන්ගේ නායකත්වයෙන් යුත් පිරිසත් ද පිලිගත් අතර, එම වෘත්තීය සමිති නිලධාරින් පෙරටු කර ගත් නායකයින් දෙපල වේදිකා ගත වුයේ සපැමිණි වැඩකරන ජනතාවගේ මහා ඔල්වරසන්හඬ මැදය. පසුබිම් තිරයෙන් දිස්වුනේ ඒකාබද්ධ වෘත්තීය මධ්‍යස්ථානය හා අපි ගොඨාභය දිනවන්නෙමු. අපේ නායක මහින්ද මහතාට ජයවේවා යනුවෙනි.

මහ සමුළුව අමතමින් ගෝඨාභය මහතා අවධාරනය කලේ ''වෘත්තීය සමිති මධ්‍යස්ථානය විසින් පිලිගත හැකි යෝජනා මාලාවක් කියවා සම්මත කර ඉදිරිපත් කිරීම ගැන සතුටු වෙනවා. එය ක්‍රියාත්මක කළ හැකියි.'' යනුවෙන් ප්‍රකාශ කිරීමේදී සභාවෙන් මහා ඔල්වරසන් හඬක් මධ්‍යසේ සිදුවිය.

සන්ධානයේ සහ පෙරමුණේ නායක මහින්ද මැතිතුමා පැවසුවේ ''වැඩකරන ජනතා බලවේගය පෙරටු කරගත් මේ මහා බලඇණියේ ශක්ති මහිමයෙන් අප රටත් ජනතාවත් බේරා ගතයුතු තීරනාත්මක අවස්ථාවක ඔබ අප මෙසේ රැස්වනවා.'' යනුවෙනි.

සමුළුවේ සාමාජිකයන් අතර බෙදාහරිනු ලැබු විධායකයන් විසින් සකසනු ලැබූ වැඩකරන ජනතා අපේක්ෂාවන් විදහා දක්වනු ලැබූ යෝජනාව මහින්ද - ගෝඨාභය ඉදිරියේ කියවූ අතර එය මහහඬ නංවමින් ඒකමතිකව සහා සම්මත විය. එම යෝජනාවන්ද, ඒකාබද්ධ වෘත්තීය සමිති බලමණ්ඩලය සමඟ එක්වූ සමිතිවල ඉල්ලීම් මාලාවද මංජුසාවල බහාලමින් නායකයින් දෙනා වෙත වෘත්තීය සමිති නායකයින්ගේ සුරත් එක්කර භාරදෙන ලදි.

අපේ මාතෘ භූමියේ නිදහසත්, වැඩකරන ජනතාව වූ අප මෙතෙක් දිනාගෙන ඇති සෑම අයිතිවාසිකමක්මත් අපගෙන් උදුරා ගැනීමට සැලසුම් කරන හා ක්‍රියාත්මක කරන යූ. ඇන්. පී.පරගැති දේශපාලනය කුමන වෙස් ගෙන ආවත් එය බලගතු ලෙස පරාජය කරමින් අපගේ රාජ්‍ය සම්පත් කොම්පැනිකාරයන්ට පාවාදීම ඇතුළු සෑම කම්කරු ජනතා විරෝධී පියවරක්ම ආපසු හැරවීමේ වැඩපිලිවෙලක් සමුළුව ඉල්ලා සිටින්නීය යනුවෙන් එම යෝජනා සංක්ෂිප්ත කල හැකිය.

සමුළුවේ පිලිගැනීමේ කථාව ඒකාබද්ධ වෘතිය සමිති මධ්‍යස්ථානයේ ප්‍රධාන ලේකම් එම්.ඩී.අතුල සහෝදරයාද, සුභපැතුම් කථාව වෘත්තිය සමිති මධ්‍යස්ථානයේ හා මහජන බැංකු අංශයේ සභාපති කේ.එම්. බණ්ඩාර සහෝදරයා විසින්ද සිදුකල අතර යෝජනාව ඉදිරිපත් කලේ ඒකාබද්ධ වෘතිය සමිති පෙරමුණේ ප්‍රධාන සංවිධායක හා ප්‍රගති බැංකු සේවක සංගමයේ ප්‍රධාන සභාපති නිශාන්ත සමරසිංහ සහෝදරයා විසින්ය.

ප.ව. 06.30ට පමණ සමුළුව සමාප්ත වූයේ මහින්ද - ගොඨාභය නායකයන්ට හරසර දක්වමින් නැගී සිටි දහස් ගණන් නියෝජිතයන් ජයවේවා, ජයවේවා යනුවෙන් දෑත් ඔසවමින් නැඟූ මහ හඬ මධ්‍යයේ නායක දෙපල සභාවෙන් නික්ම ගිය පසු සමුළුව විසිර ගියේ ඉමහත් උද්යෝගයෙනි.

## පරිපාලන නිලධාරීන් කරපටි බුරුල්කර පාරට බසී

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යේෂ්ඨ නිලධාරීන් රජය දුර්වල වීම හා දේශපාලන නියෝග නිකුත් කිරීම හේතුකොටගෙන තම ස්වාධිනත්වයට බාධා සිදුවනබව පෙන්වමින් කරුණු දක්වා තිබේ. ඇල්පිටිය තේරීම් භාර නිලධාරී ලෙස පත්වූ අයට පිටස්තර දේශපාලඥයෙක් බලපෑම් කරඇති බව වාර්තාවූ අතර, ඒ පිලිබදව වාසුදේව නානායක්කාර මන්ත්‍රිතුමා කථානායක ඉදිරියේ ප්‍රශ්නකර ඇත. ඒ පිළිබදව පරීක්ෂාකර බලා පාර්ලිමේන්තුවට වාර්තා කරන බව කථානායකතුමා දන්වා තිබේ.

පරිපාලන සේවා නිලධාරීන්ට ලැබියයුතු දීමනා ලබානොදීම හා අවිධිමත් ලෙස දේශපාලන ඇඟිලිගැසීම් සිදුවීම පිළිබඳව විරෝධය දක්වමින් ශ්‍රී ලංකා පරිපාලන සේවක සංගමය වෘත්තිය ක්‍රියාමාර්ගයකට එළඹී ඇත. ඔවුන් කෑම විවේකයේදී කරපටි බුරුලුකර ගෙන රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය ඉදිරිපිටදී පිකටි කර පෙළපාලි දැක්වීය. එයට නිසි ප්‍රතිචාර ආණ්ඩුව නොදැක්වීම නිසා සැප්තැම්බර් 09, 10 දෙදින තුල ලෙඩනිවාඩු දමා සේවයට වාර්තා නොකිරීමේ වෘතිය ක්‍රියාමර්ගයකට එලඹුනි. එම සංගමයේ සභාපති ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා ඉදිරියටත් සටන පනගන්වන බව ශක්තියට පැවසීය.

කොළඹ 10 ස්ටාර් මුද්‍රණාලයේදී මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.